# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 84 — 1973 නොවැම්බර් 02 වැනි සිකුරාද — 1973.11.02

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (IIආ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දන්වීම් ... ... ... | 1513 | ආණ්ඩුවේ නොවන දන්වීම් ... ... ... | — |
| තිරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දන්වීම් ... ... | 1529 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1529 | වෙන්දේසි කිරීම් පිළිබඳ දන්වීම් ... ... | 1531 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දන්වීම් ... ... ... | — |


සැළකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරන රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත 1973 නොවැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, යූනියන් පෙදෙසේ, විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය—තැ.පෙ. 560, කොළඹ) 1974.1.1 සිට 1974.12.31 දක්වා මෙරට සෑදූ වානේ කැබිනට් හා කබඩ් ආදිය සැපයීම සඳහා 1973 නොවැම්බර් මස 27 වැනි දින පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1973 නොවැම්බර් මස 26 වැනි සඳුද පෙ.ව. 11 වන තෙක් ටෙන්ඩර් පෝරම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 නොවැම්බර් මස 02 වැනි දින,
කොළඹ දීය.

11–130—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

### බෝගම්බර බන්ධනාගාරයට අයත් එළවළු ගෙන යන වේවැල් කූඩ විකිණීම

මහනුවර, බෝගම්බර බන්ධනාගාරයේ අධිකාරී විසින් තොගයේ ඉතිරිව ඇති එළවළු ගෙන යන වේවැල් කූඩ 250ක් විකිණීම සඳහා 1973.11.20 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ:

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණි. ටෙන්ඩර් තැන්පත් මුදල රු. 15කි. එම ටෙන්ඩර් තැන්පත් මුදල ඕනෑම දිසාපති කාර්යාලයකදී හෝ මෙම කාර්යාලයේදී තැන්පත් කළ හැකිය. ඒ සඳහා නිකුත් කරනු ලබන රිසිට් පත තමන් ඉදිරිපත් කරන ටෙන්ඩර් පතට ඇමිණිය යුතුය.

3. යම් ටෙන්ඩරයක් භාරගත් බවට ලිපියකින් දන්වා දින 7ක් ඇතුළතදී එම ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට නොහැකිවිනි නම් හෝ ඉවත් කර ගැනීමේ කාර්යය පැහැර හැරියේ නම් ටෙන්ඩර් පත් වෙනුවෙන් තැන්පත් කළ මුදල් රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඇතුළත් කරනු ලැබේ. ටෙන්ඩර් පත් පිළිගත් බවට දන්වා යැවෙන ලිපිය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට යැවිනි නම් හෝ එම ස්ථානයේ තබා ආවේ නම් හෝ ටෙන්ඩර්කරුට සිය ටෙන්ඩරය පිළිගත් බවට දන්වා යැවූනු සේ සලකනු ලැබේ. පිළිගත් ටෙන්ඩර්කරු විසින් උක්ත ද්‍රව්‍ය ඉවත් කර ගැනීමෙන් පසු තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

### සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) සහ (IIආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

4. වැඩිම මිළ සඳහන් ටෙන්ඩර්කරුට වේවැල් කුඩා දෙනු ලැබේ. ටෙන්ඩර් පත් ලියුම් කවරයක බහා සීල් තබා පහත සඳහන් අයගේ ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවීම හෝ පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක. සෑම ලියුම් කවරයකම වම් පස ඉහළ කෙළවරේ "වේවැල් කුඩා" යනුවෙන් සඳහන් කළ යුතුය. මේ සඳහා ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු නොලැබේ.

5. සාමාන්‍ය වැඩ කරන දිනයන්හි පෙ. ව. 8 සිට පෙ. ව. 11 දක්වාද, ප. ව. 1 සිට ප. ව. 3 දක්වාද, සෙනසුරාදා පෙ. ව. 8 සිට පෙ. ව. 11 දක්වාද බෝගම්බර බන්ධනාගාර කාර්යාලයෙන් විමසීමෙන් මෙම වේවැල් කුඩා පරීක්ෂා කළ හැක. ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරයේ යම් මැකීමක් හෝ වෙනස් කිරීමක් කර තිබේ නම් එයට ඔවුන්ගේ අත්සන් තැබිය යුතුය.

6. ටෙන්ඩර් පත් 1973.11.20 වැනි දින පෙ. ව. 10.15ට මහනුවර බෝගම්බර බන්ධනාගාර අධිකාරීගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. කැමැති ටෙන්ඩර්කරුවන්ට හෝ ඔහු විසින් අනුමත කරන නියෝජිතයන්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ඉදිරිපත් විය හැක.

7. තවත් වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය නම්, පහත අත්සන් කරන අයගෙන් ඒවා ලබා ගත හැක.

මහනුවර බන්ධනාගාර අධිකාරී.

1973.10.17 වැනි දින,
මහනුවර බෝගම්බර බන්ධනාගාරයේ දී ය.

11-4—73. 11. 02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හයිඩ්‍රොලික් ට්‍රක් ක්‍රේන් 1ක් සැපයීම

පහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා 73.11.22 වෙනි දින ප. ව. 1.30 තෙක් පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. ඉන්දියාවේ නිෂ්පාදිත යන්ත්‍රෝපකරණ සඳහා වූ මිළ ගණන් පමණක් සැලකිල්ලට ගනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | සැපයීම් විස්තර | ටෙන්ඩර් තැන්පත් මුදල |
| --- | --- | --- |
| එම්. ඊ/707127 | හයිඩ්‍රොලික් ට්‍රක් ක්‍රේන් 1යි | රු. 25 |

2. පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර, එම පිටපත් නිසියාකාරව සම්පූර්ණ කර අත්සන් තබා සීල් තැබූ කවරයක බහා එහි වම් කෙළවරේ "හයිඩ්‍රොලික් ට්‍රක් ක්‍රේන් සඳහා ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය 73. 11. 22 දින ප. ව. 1.30" යන්න සඳහන් කොට පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

4. 73.11.21 වෙනි දින ඇතුළුව එතෙක් පමණක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. මීට පසු ටෙන්ඩර් නිකුත් කරනු නොලැබේ.

5. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ ටෙන්ඩරය වෙනුවෙන් තැන්පත් කළ යුතු මුදල වන රු. 25 පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝක් වීදි ශාඛාවේ ලංකා බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක. 37 දරණ ගිණුමේ අයට මුදල් තැන්පත් කළ බවට නිකුත් කරනු ලබන කුවිතාන්සියක් මත පමණයි.

6. කිසිම වග විභාගයක් නොමැතිව, එවන ලද ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂෙප කිරීම හෝ එම ටෙන්ඩර් පතකින් කොටසක් හෝ සම්පූර්ණ එකම භාරගැනීමේ හිමිකම් රජය සතුවේ.

7. වැඩිමනත් විස්තර පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) කාර්යාලයෙන් ලබාගත හැකියි.

එස්. කතිරගාමිතම්බි,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට,

1973 ඔක්තෝබර් 22 වැනි දින,
පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ඉංජිනේරු අංශයේ දීය.

11-79—73. 11. 02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### රජයේ ගොවිපලවලට කොහු අඹ ඇට මද සැපයීම

කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් රජයේ ගොවිපලවලට හොඳින් පැසී ඉදුණු කොහු අඹ ඇට මද සැපයීම හා ගෙන ගොස් භාරදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව, 1973. 11. 23 වන දින පස්වරු 2.00 වනතෙක් භාරගනු ලැබේ.

| | | |
| --- | --- | --- |
| කුණ්ඩසාලේ පාසැල් ගොවිපල — අඹ ඇට මද | ... | 10,000 |
| ඹිබිල ගොවිපල — අඹ ඇට මද | ... | 30,000 |
| වාරියපොල ගොවිපල — අඹ ඇට මද | ... | 20,000 |
| මල්වත්ත ගොවිපල — අඹ ඇට මද | ... | 30,000 |
| අලුත්තරම ගොවිපල — අඹ ඇට මද | ... | 20,000 |

(i) මෙම අඹ ඇට මද තොගය 1974 ජනවාරි 31 වන දිනට පෙර සපයා අවසන් කළ යුතුය.

(ii) එක් එක් ගොවිපල සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

(iii) ගොවිපලට අඹ ගෙඩි සැපයිය යුතු අතර, එම ගෙඩි ගොවිපල කම්කරුවන් විසින් කපා ඉවත්කරගනු ලබන හොඳ තත්ත්වයේ අඹ මදවලට පමණක් ගෙවීම් කරනු ලැබේ.

2. කුණ්ඩසාලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයෙන් ලබාගන්නා ලද ෆෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසි ලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "කුණ්ඩසාලේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයේහි ඉහළ වම් කෙළවරෙහි "රජයේ ගොවිපලවලට කොහු අඹ ඇට මද සැපයීම සඳහා ටෙන්ඩර්" කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. 1973. 11. 22 වන දින දවල් 11.00 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල ආපසු ගෙවනු ලැබේ.

තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවිණි නම්, ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර, ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අයවිය යුතු යම් මුදලක් වේනොත්, එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර "රජයේ ගොවිපලවලට කොහු අඹ ඇට මද සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන්ද, ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද කවරයේ සඳහන් කොට "කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පාසැල් ගොවිපලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන" වෙත ටෙන්ඩර්කරු විසින්ම හෝ ඔහුගේ නියෝජිතයින් විසින් පුද්ගලිකව භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනම, ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණි නම්, ඒ බව කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පාසැල් ගොවිපලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින්ම වහාම දැන්විය යුතුයි.

5. කැමති නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර ඇත. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසන දින එකී වේලාවට කුණ්ඩසාලේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

කරුවෙකු විසින් කිසියම් ටෙන්ඩර් පතක් පරීක්ෂා කිරීමට කැමැත්තක් දක්වන්නේ නම්, එවැනි ටෙන්ඩරයක එවා ඇති අනුපිටපත පරීක්ෂා කළ හැක.

(6) කොන්ත්‍රාත්තුව පවත්වා ගෙනයාම පිණිස ඔවුන්ගේ හැකියාව පිළිබඳ වූ ලියකියවිලි සහ වෙනස් සාක්ෂි ඉදිරිපත් කිරීමට ජාතික කිරි මණ්ඩලයේ සභාපති විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, ඒවා ඉදිරිපත් කිරීමට ටෙන්ඩර්කරුවන් සූදනම් විය යුතුය.

(7) රජයේ දෙපාර්තමේන්තුවක්/සංස්ථාවක් සඳහා නැවිබඩු නිෂ්කාශනය හා ඉදිරිපත් කිරීම පිළිබඳ අවම වශයෙන් අවුරුදු 5ක පළපුරුද්දක් ටෙන්ඩර්කරුවන්ට තිබිය යුතුය.

(8) ජාතික කිරි මණ්ඩලයේ සභාපතිගේ බලයක් නොමැතිව යම්කිසිවෙකුට, කොන්ත්‍රාත්තුව පැවරීම හෝ අකුරු බද්දට දීම කළ නොහැක. කොන්ත්‍රාත්කරු වෙනුවෙන්, කොන්ත්‍රාත්තුව පවත්වාගෙන යාමට යම්කිසි පුද්ගලයෙකුට බලය දෙමින් කොන්ත්‍රාත්කරු විසින් නිකුත් කර ඇති ඇටෝර්නි බලය පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ජාතික කිරි මණ්ඩලය සතුව ඇත.

(9) කිසියම් ටෙන්ඩර් පතක් හෝ සියලුම ටෙන්ඩර්පත් සහ ටෙන්ඩරයකින් කිසියම් කොටසක් භාරගැනීමේ අයිතිය ප්‍රශ්නයක් නොමැතිව ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ජාතික කිරි මණ්ඩලය සතුව ඇත.

(10) කොන්ත්‍රාත්තුවේ සඳහන් කොන්දේසි ටෙන්ඩර්කරුවන් විසින් මැනවින් අවබෝධ කරගත යුතුය. සම්පූර්ණ විස්තර නොතිබුණේ යයි හෝ ඒවායේ අඩුලුහුඩුකම් තිබුනේ යයි හෝ යන කරුණු මත ඉදිරිපත් කරන ඉල්ලීම් භාරගනු නොලැබේ.

(11) තෝරාගනු ලබන ටෙන්ඩර්කරු රු. 15,000 ක ඇප මුදලක් මුදලින් තබා කොන්ත්‍රාත්තුවට එළඹිය යුතුය.

(12) ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් විස්තර, කොළඹ 5, නාරාහේන්පිට, ජාතික කිරි මණ්ඩලයේ සැපයුම් කළමනාකරුගෙන් ලබාගත හැකි වේ.

සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
නාරාහේන්පිට,
කොළඹ 5,
1973.10.24 දින.

11–148—73.11.02 දින අංක 84 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1974 කෑම ද්‍රව්‍ය සැපයීමට ටෙන්ඩර් කැඳවීම

1974 මුදල් වර්ෂය තුළ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ආයතනවලට කෑම ද්‍රව්‍ය සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් ("ලාංකික" යනුවෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියන් වූවෙකි) ටෙන්ඩර් කැඳවනු ලැබේ. කෑම ද්‍රව්‍ය සැපයිය යුතු කාල සීමාව 1974.01.01 සිට 1974.12.31 දක්වා හෝ එයට පෙර මෙම කඳවුරු වැසුවහොත් එම දිනය දක්වාය.

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා විවෘත කරන දිනය |
|---|---|---|---|
| | රු. | රු. | |
| සේනපුර පුනරුත්ථාපන කඳවුර ... ... ... | 50 | 1,000 | 16.11 1973 |
| අනුරාධපුරය පුනරුත්ථාපන කඳවුර ... ... ... | 50 | | |
| වීරවිල පුනරුත්ථාපන කඳවුර ... ... ... ... | 50 | | |
| රිදියගම පුනරුත්ථාපන කඳවුර ... ... ... | 50 | | |
| කොග්ගල පුනරුත්ථාපන කඳවුර ... ... ... | 50 | | |

ආහාර සඳහා ගණන් ඉදිරිපත් කිරීමේදී බත්, පාන්, තේ, සීනි, පරිප්පු, සුදුරු සහ කොත්තමල්ලි යන ද්‍රව්‍යයන් ඇතුළත් නොකොට ගණන් ඉදිරිපත් කළ යුතු බව හා (සියලුම ආයතනයන් සම්බන්ධයෙන් බත්, පාන්, තේ, සීනි, පරිප්පු, සුදුරු සහ කොත්තමල්ලි ආදී ද්‍රව්‍යයන් අත්හැරීමෙන් ආහාර මිශ්‍රණයේ වෙනස් කම් ඇති කර ඇති බව ද, අනුරාධපුරය සම්බන්ධයෙන් එළවළු අත්හැරිය යුතු බව ටෙන්ඩර්කරුවන් විසින් විශේෂයෙන් දත යුතුය. කොග්ගල අනුරාධපුරය, සේනපුර යන බන්ධනාගාර සම්බන්ධයෙන් මාලු ද අත්හැර ගණන් ඉදිරිපත් කළ යුතුය.

3. එක් ආයතනයක් සඳහා සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා " සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කොළඹ 9 " කියා එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් හෝ කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ මූලස්ථාන අධිකාරි ජේ. පී. දෙල්ගොඩ මහතාට භාර දී එය ලැබුණු බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ " ...... ආහාර ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩරය " කියා ලියා මෙහි 1 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.30 ට ප්‍රථම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයාට ලැබෙන සේ එවිය යුතුයි. මෙහි 1 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.35 ට කොළඹ 9, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයාගේ කාර්යාලයේදී (බන්ධනාගාර මූලස්ථානය) ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ දී එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

6. ටෙන්ඩර් පෝර්ම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස් වරයාගේ ප්‍රධාන කාර්‍යාලයෙන් ලබා ගත හැක. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ. එක් එක් බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ ඒ ඒ බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට (ඉහත 1 වැනි ඡෙදය බලන්න) පෙර දින පස්වරු 2.00 දක්වා පමණි.

7. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වූ දින සිට මාස 3 ක් යන තුරු ටෙන්ඩර්කරුවන් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම හා මැකීම්වලට ටෙන්ඩර් කරුවන් විසින් තම කෙටි අත්සන තැබිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි, ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේ හෝ කොළඹ කච්චේරිය හැර වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සි ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10 ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට නුපුළුවන් විනි නම් හෝ එසේ කිරීමෙන් වැළකී සිටී නම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන් පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වන සේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තව ද, කොන්ත්‍රාත් කඩකිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වළංගු මුදලින් රු. 3,000 ක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම කොන්ත්‍රාත්කරුවන්ට සිදුවෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස් වෙත පැවරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ නොඑසේව එහි ගෙන ගොස් භාර දුන්හොත් එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුණු ලෙස සලකනු ලැබේ. අනෙක් සියළු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. එක් එක් බන්ධනාගාරයේ එක් එක් උපලේඛන සඳහා තැන්පත් කරනු ලබන මුදල් වෙනුවෙන් වෙන වෙනම කුවිතාන්සි ලබා ගත යුතු බවත්, ඉදිරිපත් කරනු ලබන ගණන් ඉලක්කම්න් මෙන් ම වචනයෙන් ද සඳහන් කළ යුතු බවත්, එසේ එම ගණන් වචනයෙන් සඳහන් නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප විය හැකි බවත් ටෙන්ඩර්කරුවන්ගේ විශේෂ සැලකිල්ලට භාජන කරවනු ලැබේ.

11. ටෙන්ඩරය පිළිගැනීමෙන් පසු එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන්, කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට, ඇප කරුවන් වශයෙන් මවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමති වගකිවයුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි.

12. ඒ ඒ කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට අවශ්‍ය තරම් ඇප කරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍ය ය. තැන්පත් කිරීමට අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණය මෙම නිවේදනයේ 1 වැනි වගන්තියේ සඳහන් ප්‍රකාරය. ඒ ඒ බන්ධනාගාර අධිකාරි තැනගෙන් කොන්ත්‍රාත්තුව හරියාකාර කිරීමට වුවමනා කරන සියලු තොරතුරු දැනගත හැකිය.

13. ඒ ඒ ටෙන්ඩරය සඳහා වන සියලු කොන්දේසි සම්පූර්ණයෙන් ඉටුවී නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සලකා බලනු නොලැබේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශයෙන් පිළි ගැනීමේ අයිතිවාසිකම් මුළුමණින්ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබාගනු ලැබේ.

15. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් අනෙකෙකු වෙත පැවරීම හෝ බදු වශයෙන් දීම හෝ කළ නොහැක. කොන්ත්‍රාත්කරුවෙකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ බලය යම් පුද්ගලයෙකු වෙත පවරමින් නිකුත් කරන ලද ඇටෝර්නි බලය පිළිනොගෙන ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රජය සතුය.

16. ඒ ඒ බන්ධනාගාර අධිකාරීන්ට සෑහෙන තරම් කරුණු ඇත්නම් කිසියම් පුද්ගලයෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යෙදවීම ගැන තම විරුද්ධත්වය ලියා දැනුම් දිය හැක. එවැනි කිසිම පුද්ගලයෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි නොයෙදවිය යුතුය. කොන්ත්‍රාත්තුව ඉටුකිරීමේ දී කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

17. (අ) මීට ප්‍රථමයෙන් රජයේ කොන්ත්‍රාත්තුවක් භාර නොගත් ටෙන්ඩර්කරුවෙක් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේ දී තමාගේ සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය, තමන්ට අයිති දේපොළ ආදිය පිහිටි දිස්ත්‍රික්කය හෝ කොට්ඨාශය සඳහන් කොට, තමා පදිංචි පළාතේ ආදායම් පාලක තැන විසින් සහතික කරන ලද වාර්තාවක් ටෙන්ඩර් පෝරම දෙනු ලබන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉඩකඩම් හා දේපොළවල ප්‍රමාණය හා වටිනාකම එහි සඳහන් කළ යුතුයි.

(ආ) මීට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්තු ඉටු කරන ලද ටෙන්ඩර්කරුවන්, එසේ සේවය ඉටු කරන ලද්දේ, දැනට ටෙන්ඩර් කැඳවන දිස්ත්‍රික්කයේ හෝ කොට්ඨාශයේ හෝ සඳහා නොවේ නම්, තමන් විසින් එසේ කොන්ත්‍රාත්තුව ඉටු කරන ලද පළාත් හෝ දිස්ත්‍රික්ක සඳහන් කළ යුතුයි.

(ඇ) වෙන දෙපාර්තමේන්තුවකට කොන්ත්‍රාත්තු ඉටු කරන ලද ටෙන්ඩර්කරුවන්, එම දෙපාර්තමේන්තුවේ නම සහ තමා සේවය කළේ කුමන දිස්ත්‍රික්කයේ ද යන වග සඳහන් කරමින් ඒ බවට එම දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතුයි.

18. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස්වරයා සමඟ කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරියෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද, ගිණිය යුත්තේ ද, ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නා වූ නිලධාරියා ද, ඔහුට පසුව එම පදවිය දරන්නා වූ නිලධාරියා ද වේ.

19. මේ පිළිබඳව වැඩි විස්තර බන්ධනාගාර මූලස්ථානයෙන් ලබාගත හැක.

ඒ. ඒ. ද සිල්වා,
වැඩබලන බන්ධනාගාර කොමසාරිස්.

1973.10.23,
කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

11–125—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ටෙන්ඩර් දැන්වීමයි

වාලච්චේනෙහි, නැගෙනහිර කඩදසි කම්හල වෙත පහත දැක්වෙන විෂයයන් සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ:—

1. බලීච්ඩ් සෙමි–කෙමිකල් පල්ප් මෙට්‍රික් ටොන් 1000
2. අන්බලීච්ඩ් සෙමි–කෙමිකල් පල්ප් මෙට්‍රික් ටොන් 500

} ටෙන්ඩර් භාර ගැනීම 73.12.14 වෙනි දින ප.ව. 2.00 ට අවසන් කෙරේ.

3. සෝඩියම් සිලිකේට් මෙට්‍රික් ටොන් 250
4. ඇලුමිනියම් සල්ෆේට් මෙට්‍රික් ටොන් 1400
5. හයිඩ්‍රේටඩ් ලයිම් මෙට්‍රික් ටොන් 1200

} ටෙන්ඩර් භාර ගැනීම 73.12.20 දින ප.ව. 2.00 ට අවසන් කෙරේ.

ප්‍රධාන සැපයුම් කරුවන්ගේ නම් සහ ලිපිනයන් සහිත්ව ලිඛිත අයදුම් ඉදිරිපත් කිරීමෙන්, ටෙන්ඩර් ආකෘති පත් සහ වෙනත් විස්තර ලබාගත හැක. එක් එක් විෂය වෙනුවෙන් වෙන් වෙන්ව අයදුම් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස,
තැ. පෙ. 1367,
කොළඹ 2.

11–146—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### 1974 ජනවාරි මස 1 වැනි දින සිට 1974 දෙසැම්බර් 31 වැනි දින දක්වා කළුතර දිස්ත්‍රික්කයේ පාසල්වලට ' ඇදිහැය ' කිරි බිස්කෝතු ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම

මෙහි පහත දැක්වෙන සේවාවන් සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(අ) මැලිබන් සහ සිලෝන් බිස්කට්ස් සමාගම්වල සිට පහත දැක්වෙන අධ්‍යාපනික මණ්ඩලයන්හි පාසල් වලට ද,

(ආ) මැලිබන් සහ සිලෝන් බිස්කට්ස් සමාගම්වල සිට කළුතර ගබඩාවලට ද,

(ඇ) කළුතර ගබඩාවල සිට පහත දැක්වෙන අධ්‍යාපනික මණ්ඩලයන්හි පිහිටි පාසල්වලට ද, රාත්තල් විස්සකට (රු. 20) ආසන්න කිරි බිස්කෝතු සහ කඩදාසි පෙට්ටි ප්‍රවාහනය කිරීම.

නියමිත වශයෙන් ඉහත " අ " හි සේවය ක්‍රියාත්මක වේ. එසේ ද වුවත් ඉහත " ආ " සහ " ඇ" සේවාවන් ද අවස්ථාවක් පැන නැගුන හොත් ඉටු කිරීමට සූදානමින් සිටිය යුතු බව ටෙන්ඩර් ලාභීන්ට දන්වනු ලැබේ.

ඉහත සඳහන් කරන ලද අධ්‍යාපනික මණ්ඩල මෙසේ ය :—

1. අගලවත්ත උතුර
2. අගලවත්ත දකුණ
3. කළුතර

4. පානදුර
5. බණ්ඩාරගම
6. බුලත්සිංහල
7. බේරුවල
8. මතුගම
9. හොරණ.

ඉහත "අ", "ආ", සහ "ඇ" හි සඳහන් සේවාවන් සඳහා ටෙන්ඩර් පත්‍ර කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 නොවැම්බර් මස 30 වැනි දින පෙ. ව. 10 දක්වා භාර ගනු ලැබේ. මෙම කාර්යාලයෙන් ලබා ගත යුතු නියමිත ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු වේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පෙර රුපියල් සියයට (රු. 100) තැන්පත් මුදලක් මෙම කාර්යාලයේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත් අයට 1973 නොවැම්බර් 29 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද මෙහි පහතින් කියැවෙන සමිති එකී මුදල් තැන්පත් කිරීම අනවශ්‍ය ය.

ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර, ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට අපේක්ෂා කරන අය විසින් රුපියල් දහ දාහක් (රු. 10,000) වටිනා දේපළ තමා සතුව ඇති බවට ඒත්තු යන පරිදි සහතිකයක් ලබා ගෙන, කළුතර ප්‍රාදේශීය අධ්‍යාපනාධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. මෙය මෑතකදී ලබාගත් සහතිකයක් විය යුතුය. අනුමත කරන ලද සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති සහ සමූපකාර කම්කරු සමිති මගින් ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමට කලින් සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් වරයාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාගෙන් හෝ කම්කරු කොමසාරිස් වරයාගෙන් හෝ එකී සමිතියට මෙම සේවය ඉටු කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් යථා යෝග්‍ය පරිදි ලබා ගෙන කළුතර ප්‍රාදේශීය අධ්‍යාපනාධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකරණ අයට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ.

මණ්ඩල දෙකකට වැඩි සංඛ්‍යාවකට ටෙන්ඩර් ඉදිරිපත් කරන්නේ නම්, ඉල්ලුම්කරුගේ නමට ලියාපදිංචි කරන ලද 1973 වර්ෂය සඳහා බලපත්‍ර ලබා ගත් ලොරි දෙකක්වත් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. මූලික අශ්‍යතාවය ඉහත කී පරිදි ලොරි දෙකක් වන අතර, ප්‍රවාහනය භාර ගන්නා මණ්ඩල ගණන අනුවත්, ඒ ඒ මණ්ඩලවල ගමනාගමන පහසුකම් අනුවත්, අතිරේකව පාවිච්චි කළයුතු ලොරි ගණන ප්‍රාදේශීය අධ්‍යාපනාධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලැබේ. තවද, කළුතර ප්‍රදේශයේ හැර වෙනත් ප්‍රදේශවල කිරි බිස්කෝතු බෙදා යැවීම භාර ගෙන තිබේ නම් එවැනි අයවලුන් වෙත තිබිය යුතු ලොරි සංඛ්‍යාව ගැන ද ප්‍රාදේශීය අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලැබේ.

කළුතර ප්‍රාදේශීය අධ්‍යාපනාධ්‍යක්ෂකගෙන් හෝ "ඇදිගැස" සංවිධානයෙන් හෝ නිකුත් කිරීමේ ඇණවුම් පත් හෝ වෙනත් නියමයන් හෝ ලැබී සතියක් ඇතුළත පාසැල්වලට බිස්කෝතු ගෙන ගොස් භාර දීම හෝ නියම කරනු ලබන වෙනත් සේවාවන් හෝ ඉටුකළ යුතුවේ. ටෙන්ඩරයක් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමේ හෝ එහි කොටසක් පමණක් භාර ගැනීම හෝ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. ටෙන්ඩර් අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පිළිබඳ අවසාන තීරණය සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක් කල් දිය යුතුය. ටෙන්ඩර් පිළිබඳ සියලුම කොන්දේසි සහ වෙනත් විස්තර කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරිවරයාගෙන් ලබා ගත හැකිය.

ආනන්ද පස්කුවල්,
කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1973 ඔක්තෝබර් මස 19 වන දින,
කළුතර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

11-12—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### 1973 වර්ෂය සඳහා විද්‍යා උපකරණ සැපයීම

රජයේ පාසල්වල විද්‍යා විෂයයන් ඉගැන්වීම සඳහා අවශ්‍ය විද්‍යා උපකරණ සැපයීම සඳහා, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් 1973 නොවැම්බර් මස 23 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2, ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී එතැන පැමිණ සිටීමට ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර, පූර්වෝක්ත 1 වැනි ඡේදයෙහි සඳහන් වන දිනයෙහි එකී වේලාවට අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යාලයේ දී විවෘත කෙරෙනු ඇත.

3. ටෙන්ඩර්, නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතු ය. එම ආකෘති පත්‍ර 1973 නොවැම්බර් මස 22 වැනි දින පස්වරු 3.30 දක්වා කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සැපයීම් ශාඛාව) ගේ කාර්යාලයේ දී ලබාගත හැකිය.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම්පස මුදුන් කෙළවරේ 'විද්‍යා උපකරණ සැපයීම—1973 සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් පත්‍රය'' යි යනුවෙන් සටහන් කළ යුතුය.

5. ලියාපදිංචි කළ තැපැල මගින් ද ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය මෙ අයුරින් එවීමට කැමැති නොවන්නේ නම්, එවිට එම ටෙන්ඩරය මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයකු මගින් හෝ ටෙන්ඩර් පිළිගැනීමට හා ඒව ලැබුණු බව දන්වීමට බලය දී සිටින අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාරදීමට වුවද හැකිය. (එබඳු අවස්ථාවන්හි දී පූර්වෝක්ත 4 වැනි ඡේදයෙහි සඳහන් වූ විස්තර ද ටෙන්ඩර්කරුවන්ගේ නම ලිපිනය ද, ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතු ය.)

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පළමුව ටෙන්ඩර් තැන්පත් වශයෙන් රුපියල් 100 ක් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ගෙවීම් ශාඛාවෙහි හෝ කොළඹින් පිට ටෙන්ඩර්කරුවන් විසින් කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. සැම්පල, නියමිත පරිදි ඉදිරිපත් කළ යුතුය.

8. කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සැපයීම් ශාඛාව) ගෙන් ඉල්ලුම් කොට මේ පිළිබඳ වැඩිදුර විස්තර හා කොන්දේසි දැනගත හැකිය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 ඔක්තෝබර් මස 22 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

11—127—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මැලේරියා මර්දන ව්‍යාපාරය

### පාවිච්චියට ගත නොහැකි ඉසින අමතර කොටස් සහ වෙනත් විවිධ උපකරණ විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම

කොළඹ, නාරාහේන්පිට මැලේරියා මර්දන ව්‍යාපාරයෙහි ඇති පාවිච්චියට ගත නොහැකි ඉසින අමතර කොටස් සහ වෙනත් විවිධ උපකරණ විකිණීම සඳහා, මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1973 නොවැම්බර් 22 වැනි බ්‍රහස්පතින්ද පූ.භා. 11.00 වන තෙක් මැලේරියා මර්දන ව්‍යාපාරයේ අධිකාරි තැන විසින් භාර ගනු ලැබේ. කොළඹ 5, මැලේරියා මර්දන ව්‍යාපාරයේ කාර්යාල සහකාර තැනගේ මාර්ගයෙන් මැලේරියා මර්දන ව්‍යාපාරයේ අධිකාරි කාර්යාලයෙහි ඇති එම උපකරණ කාර්යාලයීය වේලාවන් ඇතුළත පරීක්ෂා කර බැලීමට පුළුවන.

උපකරණ

| | | | |
|---|---|---|---|
| යකඩ දම්වැල් අඩි 4 කෑලි | | ... | 3 |
| බුරු ඇඳන් | ... | ... | 3 |
| තීන්ත ආධාරක | ... | ... | 1 |
| සංචාරක හම් මළු | ... | ... | 1 |
| පින්තූර ... | ... | ... | 3 |
| ඉබි යතුරු | ... | ... | 10 |
| අත්නැති ලොකු පුටු | ... | ... | 1 |
| යකඩ බැරල් (ගැලුම් 4) | ... | ... | 2 |
| යකඩ බැරල් (ගැලුම් 5) | ... | ... | 11 |
| ගැලුම් මාන | ... | ... | 2 |
| මේසය උඩ තබන වර්ගයේ තරාදි | | ... | 2 |
| විදුලි පන්දම් (කෑලි 3) | ... | ... | 5 |

| | | |
|---|---|---|
| තුලාව සහ තැටි දෙක සහිත තරාදි | ... | 48 |
| ටී ජෙට් නොසල ... | ... | 4 |
| පුනීල ... ... | ... | 303 |
| ප්ලන්ගර් කූරු (පීපීඑම්/9) | ... | 550 |
| "බී" වර්ගයේ ප්ලන්ගර් මිටි (පීපී/29) | ... | 550 |
| සම්පූර්ණ පියන් (ඇස්පී ඉසින) (ඒසී/3) | ... | 586 |
| ඩිලිවරි හෝ ඩිප් නල ... | ... | 235 |
| කෙටි ලාන්ස (සෙ.මී. 60) | ... | 927 |
| කප්ලින ... ... | ... | 173 |
| දිග ලාන්ස (සෙ.මී. 105) ... | ... | 416 |
| බැම්බු ලාන්ස ... | ... | 76 |
| ප්ලයර් පෝල්ඩිම ... | ... | 46 |
| ගුස්නෙක් (ඊඑල්ජී) ... | ... | 119 |
| ගැල්වනයිස් බාල්දි ... | ... | 631 |
| තොප්පි (පෝලෝ කාකි) ... | ... | 6 |
| ඇස්පී ඉසිනයන්හි හෝස් නල | ... | 5,000 |
| ගැලුම් 2 පිල්ටර් ... | ... | 1 |
| අළු බඳුන් ... | ... | 1 |
| අත්නැති කුඩා පුටු ... | ... | 7 |
| ඇනමල් ජෝගු ... | ... | 1 |
| ඇස්පී ඉසින පොම්ප කඳන් (පීපී/2/ඒසී) | ... | 127 |
| හිස් ඩීඩීටී පොලිතින් මළු ... | ... | 2,000 |

2. කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ කොළඹ යෝර්ක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ හෝ මැලේරියා මර්දන ව්‍යාපාරයේ අධිකාරි නමින් (ගිණුම් අංක 141) ටෙන්ඩර් සඳහා රු. 50 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් හෝ මෙම කාර්යාලයේදී මුදල් ගෙවීමෙන් 1973 නොවැම්බර් 20 වැනි අඟහරුවාදා පෙ.ව. 11.00 දක්වා මැලේරියා මර්දන ව්‍යාපාරයේ අධිකාරි තැනගේ කාර්යාලයෙන් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැකි අතර, එය පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය.

3. සියළුම ටෙන්ඩර් බහාලන කවරයේ වම් උඩ පැත්තේ "පාවිච්චියට ගත නොහැකි ඉසින අමතර කොටස් සහ වෙනත් විවිධ උපකරණ මිලදී ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ලියා—කොළඹ 5, තැ.පෙ. 1472 මැලේරියා මර්දන ව්‍යාපාරයේ අධිකාරි තැන කියා ලිපි යොමුව ලිවිය යුතුය. වම් පහත කෙළවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ලිවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් ඒ සඳහා මෙම කාර්යාලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතු ය.

4. පළමුවැනි ඡෙදයේ සඳහන් දිනය සහ වේලාව ඉකුත් වූ විගස සියළුම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. සියළුම ටෙන්ඩර්කරුවන්ට ඒ වේලාවෙහි පැමිණ සිටීමට පුළුවන. ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ඔවුන් ඉදිරිපත් කර ඇති ගණන් එහිදී කියවනු ලැබේ.

5. ටෙන්ඩර් පත් පිළිගත් බව දන්වා දින තුනක් ඇතුළත ටෙන්ඩර් පතෙහි සඳහන් මුදල, මුදලින් ගෙවා බඩුබාහිරාදිය ඉවත් කර නොගත හොත්, ටෙන්ඩර් තැන්පත් මුදල් කිසිම අයිතිවාසිකමක් නැති වන සේ රාජසන්තක කරනු ලැබේ.

6. ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මැලේරියා මර්දන ව්‍යාපාරයේ අධිකාරි සතු ය.

එස්. ඇන්තනිපිල්ලෙයි,
අධිකාරි වෙනුවට,
මැලේරියා මර්දන ව්‍යාපාරය.

1973 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ 5,
නාරාහේන්පිට,
මැලේරියා මර්දන ව්‍යාපාරයේ
අධිකාරි කාර්යාලයේ දී ය.

11–99—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

යොමුව : පී.එස්.සී. 2/23/73

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### හයිපොඩමික් ඉඳිකටු සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් හයිපොඩමික් ඉඳිකටු සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ ;

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින් ;

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ.පෙ. 584 හිමි කොළඹ 10, 385, ඩීන්ස් පාර, දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973 දෙසැම්බර් මස 18 වැනි දින පෙරවරු 10.00 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින් ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම් වලින් ;

(ii) ලංකාවේ විදේශ ආණ්ඩුවල නියෝජිතයින්.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය,බෙල්ජියම, ඩෙන්මාර්ක්, ස්විස්ටර්ලන්තය ආදී රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබා ගන්නා ලෙස ඒජන්ටවරු සහ නියෝජිතයින් විදේශීය සමාගම් වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

ආර්. කේ. පී. විජේසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

1973 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ.

## SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 | Hypodermic Luer Lock Needles with regular bevel 25 guage 1" long to fit Hypodermic Luer Lock Syringes | 500 dozens | In any convenient packing |
| 2 | Hypodermic Luer Lock Needles with regular bevel 24 guage 1" long to fit Hypodermic Luer Lock Syringes | 2,000 dozens | do. |
| 3 | Hypodermic Luer Lock Needles with regular bevel 23 guage 1" long to fit Hypodermic Luer Lock Syringes | 25,000 dozens | do. |
| 4 | Hypodermic Luer Lock Neeldes with regular bevel 23 guage 1½" long to fit Hypodermic Luer Lock Syringes | 10,000 dozens | do. |
| 5 | Hypodermic Luer Lock Needles with regular bevel 22 guage 1½" long to fit Hypodermic Luer Lock Syringes | 5,000 dozens | do. |
| 6 | Hypodermic Luer Lock Needles with regular bevel 22 guage 1" long to fit Hypodermic Luer Lock Syringes | 10,000 dozens | do. |
| 7 | Hypodermic Luer Lock Needles with regular bevel 21 guage 1½" long to fit Hypodermic Luer Lock Syringes | 2,000 dozens | do. |
| 8 | Hypodermic Luer Lock Needles with regular bevel 20 guage 1½" long to fit Hypodermic Luer Lock Syringes | 2,000 dozens | do. |
| 9 | Hypodermic Luer Lock Needles with regular bevel 19 guage 1½" long to fit Hypodermic Luer Lock Syringes | 5,000 dozens | do. |
| 10 | Hypodermic Luer Lock Needles with regular bevel 22 guage 2" long to fit Hypodermic Luer Lock Syringes | 100 dozens | do. |
| 11 | Hypodermic Luer Lock Needles with regular bevel 25 guage ½" long to fit Hypodermic Luer Lock Syringes | 200 dozens | do. |

11–60—73. 11. 02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

### ආයුර්වේද දෙපාර්තමේන්තුව

#### කිළිටි රෙදි ඇපිල් ලීම සඳහා ටෙන්ඩර්

1974 ජනවාරි මස 01 දින සිට 1974 දෙසැම්බර් මස 31 දින දක්වා (එම දෙදිනද ඇතුළුව) වූ කාලය තුළ රත්නපුර ආයුර්වේද රෝහලට අයත් කිළිටි රෙදි ඇපිල් ලීම සඳහා කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 දරණ ස්ථානයෙහි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973.11.20 දින පෙ. ව. 10 දක්වා ලාංකිකයන්ගෙන් සීල් තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ. නියමිත වේලාව ඉකුත් වූ වහාම ටෙන්ඩර් විවෘත කොට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැනගැනීම සඳහා ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ගාස්තු ප්‍රමාණ කියවනු ලැබේ.

2. ටෙන්ඩර් පිටපත් 2 බැගින් කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 10ක් ආයුර්වේද කොමසාරිස් නමට කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ ආයුර්වේද කොමසාරිස් වෙතම හෝ තැන්පත් කොට ඒ සඳහා වන කුවිතාන්සිය ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පෝරම ලබාගත හැක. ආයුර්වේද කොමසාරිස් කාර්යාලයට පැමිණ පෞද්ගලිකව ටෙන්ඩර් භාරදුන හොත් ආයුර්වේද කොමසාරිස් විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් හෝ ටෙන්ඩර් භාරගත් බවට කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත. තමා කැමති නම් මෙයි ඉහළ 1 වැනි ඡේදයේ දැක්වෙන ලිපිනයට තම ටෙන්ඩරය ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට ටෙන්ඩර්කරුවෙකුට පිළිවන. "රෙදි ඇපිල්ලීමේ ටෙන්ඩරය—1974, රත්නපුර" යනුවෙන් සීල් තබන ලද ටෙන්ඩර් ඇතුළත් ලිපි කවරයේ උඩ වම් කෙළවරේ පැහැදිළිව සඳහන් කළ යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ද ලිපි කවරයේ සඳහන් කළ යුතුයි.

3. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට පෙර දින දහවල් 12 ට පෙර ටෙන්ඩර් පෝර්ම ලබාගත යුතුයි. නියමිත පෝර්මයේ නොවන කිසිම ටෙන්ඩරයක් භාරගනු නොලැබේ. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් සළකා බලනු නොලැබේ. ටෙන්ඩර් පියවූ දින සිට මසක් ගතවන තුරු සියළුම ටෙන්ඩර් පිළිගැනීම සඳහා විවෘතව තැබිය යුතුයි.

4. ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට කිසියම් ටෙන්ඩර්කරුවකුට අවශ්‍ය වුවහොත්, ආයුර්වේද කොමසාරිස් සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු ඉදිරිපත් කොට ඇති ඕනෑම ටෙන්ඩරයක අනු පිටපත පරීක්ෂාකර බැලීමට ඉඩදෙනු ලැබේ.

5. පිළිගත් ටෙන්ඩර්කරු, ඇප මුදල් වශයෙන් ටෙන්ඩරයේ මුළු වටිනාකමින් 5% ක් තැන්පත් කොට කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකිරීම වෙනුවෙන් ආයුර්වේද කොමසාරිස් සමග ගිවිසුමකට හා බැඳුම් කරයකට අත්සන් තැබිය යුතුයි. පිළිගත් ටෙන්ඩර්කරු, කොන්ත්‍රාත්තුව අත්සන් කළ පසු නොපිළිගත් ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

6. මෙම සේවය පිළිබඳ වැඩි විස්තර ආයුර්වේද කොමසාරිස්ගෙන් ලබාගත හැක.

වී. බ. වැවේගම,
ආයුර්වේද කොමසාරිස්.

1973.10.22 දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දී ය.

11-118/1—73. 11. 02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

### ආයුර්වේද දෙපාර්තමේන්තුව

#### කිළිටි රෙදි ඇපිල් ලීම සඳහා ටෙන්ඩර්

1974 ජනවාරි මස 01 දින සිට 1974 දෙසැම්බර් මස 31 දින දක්වා (එම දෙදිනද ඇතුළුව) වූ කාලය තුළ බොරැල්ල ආයුර්වේද මහ රෝහලට අයත් කිළිටි රෙදි ඇපිල් ලීම සඳහා කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 දරණ ස්ථානයෙහි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973.11.20 දින පෙ. ව. 10 දක්වා ලාංකිකයන්ගෙන් සීල් තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ. නියමිත වේලාව ඉකුත් වූ වහාම ටෙන්ඩර් විවෘත කොට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැනගැනීම සඳහා ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ගාස්තු ප්‍රමාණ කියවනු ලැබේ.

2. ටෙන්ඩර් පිටපත් 2 බැගින් කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 10ක් ආයුර්වේද කොමසාරිස් නමට කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ ආයුර්වේද කොමසාරිස් වෙතම හෝ තැන්පත් කොට ඒ සඳහා වන කුවිතාන්සිය ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ආයුර්වේද කොමසාරිස් කාර්යාලයට පැමිණ පෞද්ගලිකව ටෙන්ඩර් භාරදුන හොත් ආයුර්වේද කොමසාරිස් විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් හෝ ටෙන්ඩර් භාරගත් බවට කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත. තමා කැමැති නම් මෙයි ඉහළ 1 වැනි ඡේදයේ දැක්වෙන ලිපිනයට තම ටෙන්ඩරය ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට ටෙන්ඩර්කරුවෙකුට පිළිවන. "රෙදි ඇපිල්ලීමේ ටෙන්ඩරය—1974 බොරැල්ල" යනුවෙන් සීල් තබන ලද ටෙන්ඩර් ඇතුළත් ලිපි කවරයේ උඩ වම් කෙළවරේ පැහැදිළිව සඳහන් කළ යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ද ලිපි කවරයේ සඳහන් කළ යුතුයි.

3. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට පෙර දින දහවල් 12 ට පෙර ටෙන්ඩර් පෝර්ම ලබාගත යුතුයි. නියමිත පෝර්මයේ නොවන කිසිම ටෙන්ඩරයක් භාරගනු නොලැබේ. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් සළකා බලනු නොලැබේ. ටෙන්ඩර් පියවූ දින සිට මසක් ගතවන තුරු සියළුම ටෙන්ඩර් පිළිගැනීම සඳහා විවෘතව තැබිය යුතුයි.

4. ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට කිසියම් ටෙන්ඩර්කරුවකුට අවශ්‍ය වුවහොත්, ආයුර්වේද කොමසාරිස් සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු ඉදිරිපත් කොට ඇති ඕනෑම ටෙන්ඩරයක අනු පිටපත පරීක්ෂාකර බැලීමට ඉඩදෙනු ලැබේ.

5. පිළිගත් ටෙන්ඩර්කරු, ඇප මුදල් වශයෙන් ටෙන්ඩරයේ මුළු වටිනාකමින් 5% ක් තැන්පත් කොට කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකිරීම වෙනුවෙන් ආයුර්වේද කොමසාරිස් සමග ගිවිසුමකට හා බැඳුම් කරයකට අත්සන් තැබිය යුතුයි. පිළිගත් ටෙන්ඩර්කරු, කොන්ත්‍රාත්තුව අත්සන් කළ පසු නොපිළිගත් ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

6. මෙම සේවය පිළිබඳ වැඩි විස්තර ආයුර්වේද කොමසාරිස්ගෙන් ලබාගත හැක.

වි. බ. වැවේගම.
ආයුර්වේද කොමසාරිස්.

1973.10.22 දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුව.

11-118/2—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### කිළිටි රෙදි ඇපිල්ලීම සඳහා ටෙන්ඩර්

1974 ජනවාරි මස 01 දින සිට 1974 දෙසැම්බර් මස 31 දින දක්වා (එම දෙදිනද ඇතුළුව) වූ කාලය තුළ බෙලිඅත්ත ආයුර්වේද රෝහලට අයත් කිළිටි රෙදි ඇපිල්ලීම සඳහා කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 දරණ ස්ථානයෙහි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973.11.20 දින පෙ. ව. 10 දක්වා ලාංකිකයන්ගෙන් සීල් තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ. නියමිත වේලාව ඉකුත් වූ වහාම ටෙන්ඩර් විවෘත කොට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැනගැනීම සඳහා ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ගාස්තු ප්‍රමාණ කියවනු ලැබේ.

2. ටෙන්ඩර් පිටපත් 2 බැගින් කොළඹ 8, කොට්ටේ පාරේ අංක 325 හි, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 10ක් ආයුර්වේද කොමසාරිස් නමට කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ ආයුර්වේද කොමසාරිස් වෙතම හෝ තැන්පත් කොට ඒ සඳහා වන කුවිතාන්සිය ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. ආයුර්වේද කොමසාරිස් කාර්යාලයට පැමිණ පෞද්ගලිකව ටෙන්ඩර් භාරදුන හොත් ආයුර්වේද කොමසාරිස් විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් හෝ ටෙන්ඩර් භාරගත් බවට කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත. තමා කැමැති නම් මෙහි ඉහළ 1 වැනි ඡේදයේ දැක්වෙන ලිපිනයට තම ටෙන්ඩරය ලියාපදිංචි කළ තැපැලෙන් එවීමට ටෙන්ඩර්කරුවෙකුට පිළිවන. "රෙදි ඇපිල්ලීමේ ටෙන්ඩරය—1974 බෙලිඅත්ත" යනුවෙන් සීල් තබන ලද ටෙන්ඩර් ඇතුළත් ලිපි කවරයේ උඩ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ද ලිපි කවරයේ සඳහන් කළ යුතුයි.

3. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට පෙර දින දහවල් 12 ට පෙර ටෙන්ඩර් ෆෝර්ම ලබාගත යුතුයි. නියමිත ෆෝර්මයේ නොවන කිසිම ටෙන්ඩරයක් භාරගනු නොලැබේ. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් පියවූ දින සිට මසක් ගතවන තුරු සියළුම ටෙන්ඩර් පිළිගැනීම සඳහා විවෘතව තැබිය යුතුයි.

4. ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට කිසියම් ටෙන්ඩර්කරුවකුට අවශ්‍ය වුවහොත්, ආයුර්වේද කොමසාරිස් සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු ඉදිරිපත් කොට ඇති ඕනෑම ටෙන්ඩරයක අනු පිටපත පරීක්ෂාකර බැලීමට ඉඩදෙනු ලැබේ.

5. පිළිගත් ටෙන්ඩර්කරු, ඇප මුදල් වශයෙන් ටෙන්ඩරයේ මුළු වටිනාකමින් 5% ක් තැන්පත් කොට කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකිරීම වෙනුවෙන් ආයුර්වේද කොමසාරිස් සමග ගිවිසුමකට හා බැඳුම් කරයකට අත්සන් තැබිය යුතුයි. පිළිගත් ටෙන්ඩර්කරු, කොන්ත්‍රාත්තුව අත්සන් කළ පසු නොපිළිගත් ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

6. මෙම සේවය පිළිබඳ වැඩි විස්තර ආයුර්වේද කොමසාරිස්ගෙන් ලබාගත හැක.

වි. බ. වැවේගම,
ආයුර්වේද කොමසාරිස්.

1973.10.22 දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දී ය.

11-118/3—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### කිළිටි රෙදි ඇපිල්ලීම සඳහා ටෙන්ඩර්

1974 ජනවාරි මස 01 දින සිට 1974 දෙසැම්බර් මස 31 දින දක්වා (එම දෙදිනද ඇතුළුව) වූ කාලය තුළ යාපනය ආයුර්වේද රෝහලට අයත් කිළිටි රෙදි ඇපිල්ලීම සඳහා කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 දරණ ස්ථානයෙහි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973. 11. 20 දින පෙ. ව. 10.00 දක්වා ලාංකිකයින්ගෙන් සීල් තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ. නියමිත වේලාව ඉකුත් වූ වහාම ටෙන්ඩර් විවෘතකොට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැනගැනීම සඳහා ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ගාස්තු ප්‍රමාණ කියවනු ලැබේ.

2. ටෙන්ඩර් පිටපත් 2 බැගින් කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 යි, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 10 ක් ආයුර්වේද කොමසාරිස් නමට කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ ආයුර්වේද කොමසාරිස් වෙතම හෝ තැන්පත් කොට ඒ සඳහා වන කුවිතාන්සිය ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැක. ආයුර්වේද කොමසාරිස් කාර්යාලයට පැමිණ පෞද්ගලිකව ටෙන්ඩර් භාර දුන හොත් ආයුර්වේද කොමසාරිස් විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් හෝ ටෙන්ඩර් භාරගත් බවට කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත. තමා කැමති නම් මෙහි ඉහළ 1 වැනි ඡේදයේ දැක්වෙන ලිපිනයට තම ටෙන්ඩරය ලියාපදිංචි කළ තැපැලෙන් එවීමට ටෙන්ඩර් කරුවනට පිළිවන. "රෙදි ඇපිල්ලීමේ ටෙන්ඩරය—1974 යාපනය" යනුවෙන් සීල් තබන ලද ටෙන්ඩර් ඇතුළත් ලිපි කවරයේ උඩ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුයි. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද ලිපි කවරයේ සඳහන් කළ යුතුයි

3. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට පෙර දින දහවල් 12.00 ට පෙර ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත යුතුයි. නියමිත ෆෝර්මයේ නොවන කිසිම ටෙන්ඩරයක් භාරගනු නොලැබේ. ටෙන්ඩර් භාරගන්නා අවසාන දින හා වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් පියවූ දින සිට මසක් ගතවන තුරු සියළුම ටෙන්ඩර් පිළිගැනීම සඳහා විවෘතව තැබිය යුතුයි.

4. ටෙන්ඩරයක් පරීක්ෂාකර බැලීමට කිසියම් ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය වුවහොත්, ආයුර්වේද කොමසාරිස් සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු ඉදිරිපත් කොට ඇති ඕනෑම ටෙන්ඩරයක අනු පිටපත පරීක්ෂාකර බැලීමට ඉඩ දෙනු ලැබේ.

5. පිළිගත් ටෙන්ඩර්කරු, ඇප මුදල් වශයෙන් ටෙන්ඩරයේ මුළු වටිනාකමින් 5% ක් තැන්පත් කොට කොන්ත්‍රාත් තුව නිසි පරිදි ඉටුකිරීම වෙනුවෙන් ආයුර්වේද කොමසාරිස් සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට අත්සන් තැබිය යුතුයි. පිළිගත් ටෙන්ඩර් කරු, කොන්ත්‍රාත්තුව අත්සන් කළ පසු නොපිළිගත් ටෙන්ඩර් කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

6. මෙම සේවය පිළිබඳ වැඩිදුර විස්තර ආයුර්වේද කොමසාරිස්ගෙන් ලබා ගත හැක.

වි. බ. වැවේගම,
ආයුර්වේද කොමසාරිස්.

1973. 10. 22 දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දී ය.

11—118/4—73. 11. 02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

3. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට පෙරදින දහවල් 12 ට පෙර ටෙන්ඩර් පෝරම ලබාගත යුතුයි. නියමිත පෝරමයේ නොවන කිසිම ටෙන්ඩරයක් භාරගනු නොලැබේ. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් පියවූ දිනසිට මසක් ගතවන තුරු සියළුම ටෙන්ඩර් පිළිගැනීම සඳහා විවෘතව තැබිය යුතුයි.

4. ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට කිසියම් ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය වුවහොත්, ආයුර්වේද කොමසාරිස් සමග කටයුතු පිළියෙල කරගැනීමෙන් පසු ඉදිරිපත් කොට ඇති ඕනෑම ටෙන්ඩරයක අනුපිටපත පරීක්ෂාකර බැලීමට ඉඩදෙනු ලැබේ.

5. පිළිගත් ටෙන්ඩර්කරු ඇප මුදල් වශයෙන් ටෙන්ඩරයේ මුළු වටිනාකමින් 5% ක් තැන්පත් කොට කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකිරීම වෙනුවෙන් ආයුර්වේද කොමසාරිස් සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට අත්සන් තැබිය යුතුයි. පිළිගත් ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව අත්සන් කළ පසු නොපිළිගත් ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

6. මෙම සේවය පිළිබඳ වැඩි විස්තර ආයුර්වේද කොමසාරිස්ගෙන් ලබාගත හැක.

වි. බ. වැවේගම,
ආයුර්වේද කොමසාරිස්.

1973. 10. 22 දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දී ය.

11-118/7—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

අධ්‍යාපන දෙපාර්තමේන්තුව—කුරුණෑගල

කුරුණෑගල අධ්‍යාපන ප්‍රදේශයේ පාසැල්වලට "ඇදිහැස" කිරි විස්කෝතු ප්‍රවාහණය කිරීම

1974.1.1 සිට 1974.12.31 දක්වා කාලය තුළ මෙහි පහත දැක්වෙන සේවාවන් සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973. 11. 28 වැනි දින පෙරවරු 9 තෙක් භාර ගනු ලැබේ.

කුරුණෑගල හා මහව රජයේ ගබඩාවල සිට කාඩ්බෝඩ් පෙට්ටිවල අසුරන ලද විස්කෝතු පහත දැක්වෙන මණ්ඩලයන්හි පිහිටි රජයේ පාසල් වෙත ගෙන ගොස් විදුහල්පතීන්ට භාරදීම.

සඳහන් කරන ලද පාසැල් මණ්ඩල මෙ පරිදිය :—

1. කුරුණෑගල.
2. පොල්ගහවෙල.
3. මාවතගම.
4. වාරියපොල. (1)
5. වාරියපොල (2) (හෙට්ටිපොල ප්‍රදේශය)
6. දොඩන්ගස්ලන්ද.
7. දඹදෙනිය.
8. කුලියාපිටිය.
9. නක්කාවත්ත.
10. කටුගම්පොල
11. ගිරියාල (1) (ඉබ්බාගමුව ප්‍රදේශය)
12. ගිරියාල (2) (පොල්පිතිගම ප්‍රදේශය)
13. මහව.
14. ගල්ගමුව.

2. මහව හා ගල්ගමුව මණ්ඩලවලට මහව ගබඩාවෙනුත් අනෙකුත් සියළුම මණ්ඩලවලට කුරුණෑගල ගබඩාවෙනුත්, "ඇදිහැස" විස්කෝතු ගෙන යා යුතුව ඇත.

3. ටෙන්ඩර් කරුවන් මෙම සේවය සඳහා ටෙන්ඩර් පිළියෙල කිරීමේදී රාත්තල් විස්සක් බර විස්කෝතු පෙට්ටියක් සඳහා දුර ප්‍රමාණය නොතකා ගබඩාවේ සිට පාසල් දක්වා ගෙනගොස් පාසල් ප්‍රධානීන්ට භාරදීම සඳහා අය කරන ගාස්තුව සඳහන් කළ යුතුය. එක් ටෙන්ඩර් කරුවෙකුට මණ්ඩල එකක් හෝ ඊට වැඩි ගණනක් ඉල්ලුම් කළ හැකිය. නමුත් එක් එක් මණ්ඩලය සඳහා වෙන වෙනම ගණන් සඳහන් කළ යුතුය.

4. කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ පරිපාලන නිලධාරීගෙන් හෝ ප්‍රධාන ලිපිකරු මහතාගෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පෙර රු. 100 ක තැන්පත් මුදලක් කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය. 1973.11.27 වැනි දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද සමිතියක් නම් එකී මුදල තැන්පත් කිරීම අනවශ්‍යය. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර පිටපත් දෙකකින් යුක්ත විය යුතුය.

5. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට පෙර, ටෙන්ඩර් භාරදීම අපේක්ෂා කරන අයවළුන් විසින් කුරුණෑගල අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රු. 15,000 ක් වටිනා ස්ථිර දේපල ඇති බවට ඒත්තු යන පරිදි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. මණ්ඩල දෙකක් සඳහා පමණක් ප්‍රවාහන කටයුතු සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කරන විට ඉල්ලුම් කරුගේ නමින් ලියා පදිංචි කරන ලද 1974 වර්ෂයට බල පත්‍රයක් ලබා ගත් එක ලොරියක් ද, මණ්ඩල දෙකකට වැඩි ගණනක ප්‍රවාහන කටයුතු සඳහා ඉල්ලුම් කරන විට ඉල්ලුම්කරු නමින් ලියා පදිංචි කරන ලද 1974 වර්ෂයට බලපත්‍ර ලබාගත් ලොරි දෙකක් ඇති බවට සාක්ෂිද ඉදිරිපත් කළ යුතුය. මූලික අවශ්‍යතාවය එසේ වුවත් ප්‍රවාහනය භාර ගන්නා මණ්ඩල ගණන අනුවත් ඒ ඒ මණ්ඩලවල ගමනා ගමන පහසුකම් අනුවත් අතිරේකව පාවිච්චි කළ යුතු වාහණ ගණන ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලැබේ. කුරුණෑගල අධ්‍යාපන ප්‍රදේශයේ හැර වෙනත් අධ්‍යාපන ප්‍රදේශයක ඇදිහැස විස්කෝතු ප්‍රවාහන කොන්ත්‍රාත්තු වෙනුවෙන් ඉල්ලුම් කර ඇති හෝ ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන කොන්ත්‍රාත්තුකරුවන් විසින් ඒ සඳහා අවශ්‍ය ලොරි ගණන ඇති බවට අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සෑහීමකට පත්වන අන්දමින් කරුණු ඔප්පු කළ යුතුය.

6. ලියාපදිංචි කරන ලද සමුපකාර හෝ ග්‍රාම සංවර්ධන සමිති මගින් ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමට කලින් කුරුණෑගල අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාගෙන් හෝ කම්කරු කොමසාරිස් තුමාගෙන් හෝ එකී සමිතියට මෙම සේවාව ඉටු කිරීමට හැකියාව ඇති බවට සහතිකයක් යථා යෝග්‍ය පරිදී ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ නො කළ අයට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු නො ලැබේ.

7. ටෙන්ඩරයක් සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කිරීම හෝ එහි කොටසක් පමණක් භාර ගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. ටෙන්ඩර් අපේක්ෂකයින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිබඳ අවසාන තීරණය සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක් කල් දිය යුතුය.

8. භාර ගන්නා ලද ටෙන්ඩර් පත්‍ර 1973. 11. 28 වැනි දින පෙ. ව. 10 ට කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට අවසර ඇත.

9. අධ්‍යාපන අධ්‍යක්ෂතුමා නියම කරන මුදලක් ඇප වශයෙන් තැන්පත් කිරීමට තෝරාගත් ටෙන්ඩර්කරුවන් සූදානම් විය යුතුය. හයවැනි ඡේදයේ සඳහන් අනුමත කර ඇති සමිතිවලට මෙම ඇප මුදල් අදාල නොවේ.

10. කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙන් හෝ ඇදිහැස සංවිධානයෙන් හෝ නිකුත් කිරීමේ ඇණවුම්පත් ලැබී දින හතක් ඇතුළත පාසැල්වලට විස්කෝතු ගෙනගොස් භාරදී විදුහල්පතිගෙන් සහතික ලබාගත යුතුය. බෙදා හැරීමේ ප්‍රමාදයන් පිළිබඳ නියමිත දඩයක් ගෙවීමට කොන්ත්‍රාත්කරුවන් බැඳී සිටිය යුතුය.

11. මේ පිළිබඳව සියළුම කොන්දේසි හා වෙනත් විස්තර කුරුණෑගල අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් සතියේ දිනක කාර්යාල වේලාව තුලදී ලබාගත හැක.

පියසිරි වන්නිආරච්චි,
කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

අධ්‍යාපන කාර්යාලය,
කුරුණෑගල, 1973. 10. 20.

11-52—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

1974 ජනවාරි මස 1 වැනිදා සිට 1974 දෙසැම්බර් 31 වන දයින් අවසන් වන වර්ෂය තුල මේ සමග ඇති උපලේඛණයේ 1 වැනි තීරයෙහි දක්වා ඇති අමු කොස්කොළ සැපයීමට එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ලාංකිකයින්ගෙන් හෝ ලාංකික ආයතන වලින්, වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ තැන විසින් භාර ගනු ලැබේ.

2. මෙම කාර්යාලය මගින් සපයන ලද ෆෝර්මවල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. මේ සමග ඇති උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනවල පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකියි. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර් කරුවෙකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමග ඇති උපලේඛණයේ 2 වැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට නිකුත් කෙරෙන කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රය ලබා ගැනීමට පළමුව ඉදිරිපත් කළ යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ එවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර් පත්‍ර නිකුත් කෙරෙන අවසාන දිනට පෙර දින දවල් 12 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය ෆෝර්ම ලබාගත යුතුය. තැපෑලෙන් ෆෝර්ම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල්වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය ෆෝර්ම ලබාගත හැකියි.

6. සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ වෙත දන්විය යුතුය. මේ සඳහා අවශ්‍ය ෆෝර්ම එම කාර්යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැන ගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නොහැකි බැවින්, තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුය.

7. සෑම ටෙන්ඩරයක්ම ඉහත සඳහන් වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ තැනගේ නමට එවිය යුතුය. සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයේ වම්පස උඩ කෙලවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත් එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂවරයාට පුද්ගලිකව භාර දීමෙන් හෝ එය ලැබුණු බවට කුවිතාන්සියක් ලබා ගත හැක. ටෙන්ඩර්කරුවන්ට තම ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් ද එවීමට පුළුවන. ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දින පෙ.ව. 10ට පසු තැපෑලෙන් එවන හෝ පැමිණ බාර දෙන සෑම ටෙන්ඩර් පත්‍රයක් ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. ආයතනයට අවශ්‍ය අමු කොස්කොළ ප්‍රමාණය දළ වශයෙන් වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ තුමාගෙන් ලබාගත හැකිය.

9. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය.

10. කිසිම විමසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් ම හෝ කොටසක් භාර ගැනීම ද, නැතහොත් සියලුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ බලය ද රජය සතුව ඇත.

11. වැඩි විස්තර සඳහා මෙම කාර්යාලයට අයදුම් පත් එවීමෙන් දැන ගත හැකිය.

වෛද්‍ය කේ. නිත්‍යානන්ද,
වෛද්‍ය. පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ.

1973 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ 8,
වෛද්‍ය පර්යේෂණායතනයේ දී ය.

#### උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය |
|---|---|---|---|
| | රු. | රු. | |
| 1. වෛද්‍ය පර්යේෂණායතනයට අමු කොස්කොළ සැපයීම ... | 100 ... | 300 ... | 21.11.1973 පෙරවරු 10 ට |

11–129—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

### ආහාර දෙපාර්තමේන්තුව

ගාළු රේගුවේ සහ ගාළු දුම්රිය ස්ථානයේ සිට ගබඩාවන් වෙත ආහාර ද්‍රව්‍ය ලොරිවලින් ප්‍රවාහණය කිරීම

1974. 01. 01 දින සිට 1974. 12. 31 වැනි දින දක්වා කාලය තුලදී සහල්, සීනි, පිටි හා වෙනත් ආහාර ද්‍රව්‍යයන් ගාළු රේගුවේ සහ ගාළු දුම්රිය ස්ථානයේ සිට ගාළු දිස්ත්‍රික්කය තුල පිහිටි ආහාර ගබඩාවන් වෙත ලොරිවලින් ප්‍රවාහණය කිරීම සඳහා 1973. 11. 15 දින පස්වරු 1.30 දක්වා කොළඹ 2, යුනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් භාරගනු ලබන්නේ, තමන් සතුව යටත් පිරිසෙයින් ලොරි රථ දෙකක් (2) වත් ඇති ප්‍රවාහකයින්ගෙන් පමණයි. තවද, ඔවුනට පැවරෙන ප්‍රවාහණ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍යවන අතිරේක ලොරි රථ ප්‍රමාණය සැපයීමට ඔවුනට හැකියාව තිබිය යුතුය.

3. කොළඹ 2, යුනියන් පෙදෙසේ අංක 330, දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් 1973. 11. 14 දින දවල් 12.00 දක්වා රුපියල් 250ක තැන්පත් මුදලක් ගෙවා ඉහත "2" ඡේදයේ සඳහන් කරුණු පිළිබඳව සාධක ඉදිරිපත් කොට ලබාගත හැකි ආකෘති පත්‍රවල 'ද්වෛපිටපතකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. 'වැඩි විස්තර ආහාර කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ව්. පත්මනාදන්,
ආහාර කොමසාරිස්.

1973 ඔක්තෝබර් මස 12 දින,
කොළඹ 2, ආහාර දෙපාර්තමේන්තුවේ දී ය.

11-117/1 —73. 11. 02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

### ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

**කොළඹ වාප්පුවේ සිට ගබඩාවන් වෙත ආහාර ද්‍රව්‍ය ලොරිවලින් ප්‍රවාහණය කිරීම පිණිස ටෙන්ඩර් කැඳවීම**

1974. 01. 01 දින සිට 1974. 12. 31 වැනි දින දක්වා කාලය තුලදී සහල්, සීනි, පිටි හා වෙනත් ආහාර ද්‍රව්‍යයන් කොළඹ වාප්පුවේ සිට ආහාර ගබඩාවන් වෙත ලොරිවලින් ප්‍රවාහණය කිරීම සඳහා 1973. 11. 15 දින ප. ව. 1.30 දක්වා කොළඹ 2, අංක 330 යුනියන් පෙදෙසේ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් භාරගනු ලබන්නේ තමන් සන්තකව යටත් පිරිසෙයින් ලොරි දෙකක්වත් ඇති ප්‍රවාහකයින්ගෙන් පමණකි. තවද, ඔවුනට පැවරෙන ප්‍රවාහණ කොන්ත්‍රාත්තුව නිසිපරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය වන අතිරේක ලොරි රථ ප්‍රමාණය සැපයීමට ඔවුනට හැකියාව තිබිය යුතුය.

3. කොළඹ 2, යුනියන් පෙදෙසේ අංක 330, දරණ ස්ථානයේ පිහිටි ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් 1973. 11. 14 දින දවල් 12.00 දක්වා රුපියල් 250 ක තැන්පත් මුදලක් ගෙවා ඉහත "2" ඡේදයේ සඳහන් කරුණු පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කොට ලබාගත හැකි පෝර්ම වල දෙපිටපතකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. වැඩි විස්තර ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ටී. පත්මනාදන්,
ආහාර කොමසාරිස්,

1973 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ 2, යුනියන් පෙදෙසේ,
ආහාර කොමසාරිස් කාර්යාලයේ දීය.

11–117/2—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

### ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

**කොළඹ, වාප්පුවේ සිට ගබඩාවන් වෙත ආහාර ද්‍රව්‍ය නොබෝ තොග ලොරිවලින් ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම (විශේෂ)**

1974. 01. 01 සිට 1974. 12. 31 වැනි දින දක්වා කාලය තුලදී සහල්, සීනි, පිටි හා වෙනත් ආහාර ද්‍රව්‍ය නොබෝ තොග කොළඹ වාප්පුවේ සිට ගබඩාවන් වෙත ලොරි වලින් ප්‍රවාහණය කිරීමේ විශේෂ කොන්ත්‍රාත්තුව යටතේ ලොරි සැපයිය හැකි ප්‍රවාහකයින්ගෙන් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973. 11. 20 දින ප. ව. 1.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. මෙම කොන්ත්‍රාත්තුව යටතේ කොළඹ වරායේ නැවක ඇති ආහාර ද්‍රව්‍ය ප්‍රමාණය ආහාර දෙපාර්තමේන්තුවේ ගබඩාවන් වෙත ප්‍රවාහණය කිරීමේ වගකීම ප්‍රවාහණ කොන්ත්‍රාත්කරුට පැවරෙන අතර, එම නැවෙහි ආහාර ද්‍රව්‍ය ප්‍රවාහණය කිරීම සඳහා අවශ්‍ය සම්පූර්ණ ලොරි රථ ප්‍රමාණය සැපයීම කොන්ත්‍රාත්කරුගේ වගකීම වන්නේ ය. තවද, මෙම කොන්ත්‍රාත්තුව යටතේ කොන්ත්‍රාත්කරු විසින් කාලගුණය යහපත්ව පවතින අන්දම අනුව වරායේ වැඩ කරන පැය දහ හතකින් යුත් දිනකට අඩු වශයෙන් ආහාර ද්‍රව්‍ය ටොන් 800 බැගින් ප්‍රවාහණය කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වුවහොත් වරාය සංයුක්ත මණ්ඩලයට ගෙවිය යුතු කම්කරු කණ්ඩායම් ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතුය. දිනකට ටොන් 1,200 ට වැඩියෙන් ප්‍රවාහණය කරන අවස්ථාවලදී එම ටොන් 1,200 ට වැඩියෙන් ප්‍රවාහණය කරනු ලබන සෑම ටොන් එකකටම ටොන් එකක් ප්‍රවාහණය කිරීමට එකඟවූ ගාස්තුවට අමතරව එම ටොන් එකක් ප්‍රවාහණය කිරීමේ ගාස්තුවෙන් 25% ක අතිරේක ගෙවීමක් ද කරනු ඇත.

3. කොළඹ 2, යුනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් 1973. 11. 19 දින දහවල් 12.00 දක්වා පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කොට ලබාගත හැකි ටෙන්ඩර් ආකෘතිපත්‍රවල දෙපිටපතකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

(i) ආහාර කොමසාරිස් වෙත රු. 300 ක මුදලක් තැන්පත් කර ඒ සඳහා ලත් කුවිතාන්සියක්.

(ii) ආහාර දෙපාර්තමේන්තුවේ හෝ වෙනයම් දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ ප්‍රවාහණ කටයුතුවල යෙදී ලබාගත් පළපුරුදුකම් සනාථ කෙරෙන සහතිකයක්.

(iii) ශ්‍රී ලංකා ජනරජය සමග බැඳුන කිසිම කොන්ත්‍රාත්තුවක කොන්දේසි කඩ නොකරන ලද බවට සහතික කරන ලද ප්‍රකාශනයක්.

4. වැඩි විස්තර ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ටී. පත්මනාදන්,
ආහාර කොමසාරිස්,

1973 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ 2,
අංක 330, යුනියන් පෙදෙසේ,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දීය.

11–117/3—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

### ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

**උඩවලවේ ව්‍යාපාරයේ ගොවි කර්මාන්ත පර්යේෂණ හා ව්‍යාප්ති මධ්‍යස්ථානයට අවශ්‍ය පොත් සහ සඟරා සැපයීම**

ටෙන්ඩර් අංක : බී.ජේ.පී. අවසාන දිනය : 1974 මාර්තු 05 දින

උඩවලවේ යෝජනා ක්‍රමයට අවශ්‍ය පොත් සහ සඟරා සැපයීම හා භාරදීම සඳහා ලංකාවේ කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ අංක 415 දරණ ස්ථානයේ පිහිටි ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ, මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1974 මාර්තු 05 වෙනි දින පෙ. ව. 10 තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. මෙම සැපයීම් ලබා ගැනීම සඳහා මුදල් යොදවනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ අරමුදල් සම්පත් වල ණය මුදලින් බැවින්, ලබාගත යුතු යෝග්‍ය ස්ථානවල සැපයුම් කරුවන්ගෙන් සහ ඔවුන් වෙනුවෙන් පමණක් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

3. විශේෂ අරමුදල් සම්පත් වලින් සැපයීම් ලබාගන්නේ පහත සඳහන් යෝග්‍ය ස්ථාන වලිනි :—ඕස්ට්‍රේලියාව, බෙල්ජියම, කැනඩාව, ඩෙන්මාර්කය, ජර්මන් සමූහාණ්ඩුව, පින්ලන්තය' ඉතාලිය, නෝර්වේ, ස්විට්සර්ලන්තය, ජපානය, නෙදර්ලන්තය, එක්සත් රාජ්‍යය සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් සංවර්ධනය වන සාමාජික රටවල් : (ඇෆ්ගනිස්ථානය, බ්‍රිතාන්‍ය සලමන් දූපත, චීන සමූහාණ්ඩුව, බුරුමය, ෆිජී, හොංකොං, ඉන්දියාව, ඉන්දුනීසියාව, කේමර් සමූහාණ්ඩුව, ද. කොරියන් සමූහාණ්ඩුව, ලාඕසය, මැලේසියාව, නේපාලය, පකිස්ථානය, නිව්ගිනියාව සහ පපුවා දේශ සීමාව, පිලිපීනය, සිංගප්පූරුව, තායිලන්තය, ටොන්ගාව, වියට්නාම් සමූහාණ්ඩුව (සයිගොන්) බටහිර සමෝආව, බංගලා දේශය.

4. සම්පූර්ණ විස්තර සහ ටෙන්ඩර් ලියකියවිලි කොළඹ 7, බෞද්ධලෝක මාවතේ, අංක 415 දරණ ස්ථානයේ පිහිටි ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ, මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ ලේකම් ගේ කාර්‍යාලයෙන් ලබාගත හැක.

5. ටෙන්ඩර් ලියකියවිලි පහත සඳහන් තානාපති කාර්‍යාලවලින්ද ලබාගත හැක :—

(අ) ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(ආ) කැනඩාවේ ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(ඇ) ඩෙන්මාර්කයේ සිටින ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් තුමා
(ඈ) ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ සිටින අතිගරු ශ්‍රී ලංකා තානාපති තුමා, බෙල්ජියම නෙදර්ලන්තය සහ නෝර්වේ
(ඉ) පින්ලන්තයේ සිටින අතිගරු ශ්‍රී ලංකා තානාපති තුමා
(ඊ) ඉතාලියේ සිටින අතිගරු ශ්‍රී ලංකා තානාපති තුමා
(උ) ස්විට්සර්ලන්තයේ එක්සත් ජාතීන්ගේ කාර්‍යාලය සඳහා ඇති ශ්‍රී ලංකා සමූහාණ්ඩුවේ කොන්සල් ජනරාල් කාර්‍යාලය සහ දූත මෙහෙය
(ඌ) ජපානයේ සිටින ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(එ) එක්සත් රාජධානියේ සිටින ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(ඒ) ඉන්දියාවේ සිටින ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(ඩ) ඉන්දියාවේ සිටින වෙළඳ කොමසාරිස් තුමා
(ඞ) ඉන්දුනීසියාවේ සිටින අතිගරු ශ්‍රී ලංකා තානාපති තුමා
(ක) සීවුල්හි කොරියන් සමූහාණ්ඩුවේ සිටින ආර්ථික සහයෝගතා පිළිබඳ අධ්‍යක්ෂක තුමා
(ග) මලයාසියාවේ සිටින ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(ච) බටහිර පකිස්ථානයේ සිටින ශ්‍රී ලංකාවේ වෙළඳ කොමසාරිස් තුමා

(ඡ) ශ්‍රී ලංකා තානාපති තුමා, මැනිලා පිලිපයින්ස්
(ඣ) ගරු වෙළඳ කොමසාරිස් තුමා, සිංගප්පූරුව
(ද) සංවර්ධන අධ්‍යක්ෂක ජාත්‍යන්තර සහයෝගතා සහ සංවර්ධන මණ්ඩලයේ මුදල් අංශය, ටයිපෙයි චීන සමූහාණ්ඩුව
(න) තායිලන්තයේ ශ්‍රී ලංකා නියෝජිත තානාපති තුමා
(ප) ප්‍රජාතන්ත්‍රවාදී වියට්නාම් සමූහාණ්ඩුවේ කොන්සල් ජනරාල් තුමා, නව දිල්ලිය—ඉන්දියාව
(බ) බුරුමයේ තිබෙන ශ්‍රී ලංකා තානාපති කාර්‍යාලය.

6. 1974 මාර්තු 05 වෙනි දින පෙ.ව. 10.00 තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ. යෝග්‍ය ස්ථානවල ප්‍රධානීන් වෙනුවෙන් ටෙන්ඩර් පත් ඉදිරිපත් කරන මෙරට නියෝජිතයින් විසින් ටෙන්ඩර් ලියකියවිලි කට්ටලයක් වෙනුවෙන් ආපසු ගෙවනු ලබන රු. 250/- ටෙන්ඩර් තැන්පත් මුදලක් ද, අවලංගු කරන ලද මින් එක් කට්ටලයක් වෙනුවෙන් ආපසු නොගෙවන රු. 10/-ක ගාස්තුවක්ද, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන ගණකාධිකාරිට මුදලින් ගෙවිය යුතුය.

සභාපති,
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

තැ.පෙ. 524,
කොළඹ,
1973.11.02.

11-135—73.11.02 වැනි දින අංක 84 දරන ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කෑගල්ල බලවේග ආයතනය අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973. 11. 22 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 17,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට, 1973.11.21 දින මධ්‍යාහ්න 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතුවේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1(1/72)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973.10.20.

11-113—73.11.02 වැනි දින අංක 84 දරන ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

පානදුර, කෙසෙල්වත්ත ලෝහ භාණ්ඩ අභ්‍යාස ආයතනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා, කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973.11.22 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 25,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට, 1973.11.21 දින මධ්‍යාහ්න 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතුවේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1-(1/71)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973.10.20.

11-114—73.11.02 වැනි දින අංක 84 දරන ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### මයියොක්කා පිටි සැපයීම සඳහා මිළ ගණන්

මසකට මයියොක්කා පිටි ටොන් 50 ක් සැපයීම සඳහා කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මිළ ගණන් කැඳවනු ලැබේ.

2. මිළ ගණන් පත්‍රිකාවල පහත සඳහන් විස්තර අඩංගු විය යුතුය :—

(අ) මසකට සැපයීමට හැකි ප්‍රමාණය.
(ආ) මරදානේ ඕන්ස් පාරේ නූල් වෙළඳ ගබඩාවට ටොන් එකක් ගෙනත් භාරදීමට මිළ.

3. 1973. 11. 22 දින උදේ 10 ට හෝ ඊට පෙර ලැබෙන සේ මිල ගණන් කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය.

4. කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි " මයියොක්කා පිටි සඳහා මිළ ගණන් " යන්න සඳහන් කළ යුතුය.

5. වැඩි විස්තර කුඩා කර්මාන්ත අධ්‍යක්ෂකගෙන් ලබා ගත හැක.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(4/35)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973. 10. 22.

11-115—73.11.02 වැනි දින අංක 84 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ධීවර සංස්ථාව

### ටින්මාලු ලේබල් මුද්‍රණය කර සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම.

ඉහත සඳහන් සේවය සඳහා ලංකා ධීවර සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 73. 1. 12 දින ප. ව. 2.30 දක්වා සිල් තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

රුපියල් 50 ක ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලක් ගෙවීමෙන් පසු පහත අත්සන් තබන අයගෙන් 1973. 11. 10 වැනි දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක.

කළමනාකාර සැපයීම් සහ ගබඩා.

රොක්හවුස් පටුමග,
කොළඹ 15.
1973 ඔක්තෝබර් මස 20 වැනි දින.

11-121—73.11.02 වැනි දින අංක 84 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

1974 වර්ෂයට අවශ්‍ය මුද්‍රිත පෝර්ම සහ රෙජිස්තර (සම්පාදක, සේවක මණ්ඩල හා ලේකම් කොට්ඨාශය සඳහා) මුද්‍රණය කර සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුල පාරේ, අංක 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973.12.05 වෙනිද පෙරවරු 10.00 වන තෙක් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝර්මවල ලියා අනු පිටපතකින්ද යුක්ත කොට එවිය යුතුයි. මෙම පෝර්ම පත් කොළඹ 5, කිරුල පාරේ, අංක 200 දරණ ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ, වාණිජ කළමනාකාර තැනගේ කාර්යාලයෙන් 1973.12.04 වෙනි දින දවල් 12.00 වන තෙක් ලබාගත හැකිය. පෝර්ම පත් ලබා ගැනීමට කොළඹ 5, කිරුල පාරේ, අංක 200 දරණ ස්ථානයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් රු. 100/-ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබා ගන්නා ලද රිසිට් පත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා ගාස්තු වශයෙන් රු. 10/-ක මුදලක්ද මෙයට අමතරව අය කරනු ලැබේ.

වැඩි විස්තර මෙම කාර්යාලයෙන් ලබා ගත හැක.

වාණිජ කළමනාකාර තැන.
ලංකා ගමනාගමන මණ්ඩලය.

200, කිරුල පාර,
කොළඹ 5.

11-134—73.11.02 වැනි දින අංක 84 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

1974 වර්ෂයට අවශ්‍ය ළමා හා විශ්ව විද්‍යාල වාර ප්‍රවේශ පත්‍ර මුද්‍රණය කර සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ, අංක 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1973.12.04 වෙනිද පෙරවරු 10.00 වන තෙක් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝර්ම වල ලියා අනු පිටපතකින්ද යුක්ත කොට එවිය යුතුයි. මෙම පෝර්ම පත් කොළඹ 5, කිරුළ පාරේ, අංක 200 දරණ ස්ථානයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ වාණිජ කළමනාකාර තැනගේ කාර්යාලයෙන් 1973.12.03 වෙනි දින දවල් 12.00 වන තෙක් ලබාගත හැකිය. පෝර්ම පත් ලබා ගැනීමට කොළඹ 5, කිරුල පාරේ, අංක 200 දරණ ස්ථානයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරිතැන වෙත මුදලින් රු. 100/- ක් තැන්පත් කර ඒ වෙනුවන් ලබා ගන්නා ලද රිසිට් පත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා ගාස්තු වශයෙන් රු. 10/-ක මුදලක්ද මෙයට අමතරව අය කරනු ලැබේ.

වැඩි විස්තර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

200, කිරුල පාර,
කොළඹ 5,
1973.10.22

වාණිජ කළමනාකාරතැන.
ලංකා ගමනාගමන මණ්ඩලය.

11-132—73.11.02 වැනි දින අංක 84 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### කොළඹ දුම්රිය දොඹකරාංගනයේ හා කැලණිවැලි අංගනයේ සිට වැලිකඩ බන්ධනාගාරීය කර්මාන්ත අංශයට දැව (කඳන්) ප්‍රවාහනය කිරීම 1974

1974 මුදල් වර්ෂය තුළ කොළඹ දුම්රිය දොඹකරාංගනයේ සිට වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත අංශයට (කඳන්) ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් පහත අත්සන් කරන මා විසින් 1973 නොවැම්බර් මස 20 වෙනි දින පෙ. ව. 10.00 දක්වා භාරගනු ලැබේ.

2. වලිකඩ බන්ධනාගාරයේදී දැව (කඳන්) ලොරිවලින් බෑම සඳහා කම්කරුවන් සපයනු ලැබේ. දැව (කඳන්) පැටවීම සඳහා කම්කරුවන් යොදවාලීම ආදිය ගැන රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව වැඩ පිළිවෙලක් සකස් කොට ගත යුත්තේ සාර්ථක වූ ටෙන්ඩර්කරු විසිනි. ටෙන්ඩර්කරු දිනපතා දුම්රිය අධිකාරී හමුවී බන්ධනාගාර දෙපාර්තමේන්තුවට නානා ස්ථානවලින් ලැබෙන දැව (කඳන්) පිළිබඳ සොයා බලා ඒවා ඉවත් කර ගැනීම පිණිස අවශ්‍ය බලපත් ලබා ගැනීම සඳහා නොපමාව ක්‍රියාකල යුතුය. ඉක්බිතිව ඒ සියල්ල වැලිකඩ බන්ධනාගාරයට ප්‍රවාහනය කළ යුතුය. දැව (කඳන්) පැටවීමේදී, ප්‍රවාහනයේදී, හා දුම්රිය ස්ථානයේ දැව (කඳන්) තිබෙන්නට හැරීමෙන් ගෙවන්නට සිදුවන ගාස්තු ආදිය නිසා මෙම දෙපාර්තමේන්තුවට යම්කිසි ආලාභ හානියක් සිදුනොවන්නට කටයුතු කිරීම කොන්ත්‍රාත්කරුගේ වගකීමය. උක්ත හේතූන් නිසා යම්කිසි අලාභයක් විඳීමට මෙම දෙපාර්තමේන්තුවට සිදුවුනි නම් ඒ වියදම් සියල්ල කොන්ත්‍රාත්කරුගේ මුදල්වලින් අඩුකර ගන්නවා ඇත.

3. කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ කර්මාන්ත අංශයට බඩු භාරදිය හැක්කේ සතියේ දිනයන්හි පෙ. ව. 7.00 සිට 10.30 දක්වාත්, ප. ව. 1.00 සිට 3.30 දක්වාත්, සෙනසුරාදා දිනයන්හි පෙ. ව. 7.00 සිට 10.30 දක්වාද යන කාලයන් තුළ පමණකි.

4. මුදලින් රුපියල් පනහක් (රු. 50) කොළඹ බන්ධනාගාර කොමසාරිස්තුමාගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට නම් ඕනෑම කච්චේරියක හෝ එකී මුදල තැන්පත් කළ බවට කුවිතාන්සියක් පහත අත්සන් කරන අයට ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා නිකුත් කරන ටෙන්ඩර් පෝරම වර්ෂ 1973 නොවැම්බර් මස 19 වෙනි දින ප. ව. 2.00 දක්වා ලබාගත හැක.

5. ටෙන්ඩර් පත්‍රයක් සීල් තැබූ කවරයක්හි බහා එහි වම්පස උඩ කෙළවරෙහි "දැව (කඳන්) ප්‍රවාහනය සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ ඒ සඳහා වෙන්කර ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක.

6. නියම කරණ මිල ගණන් ටෙන්ඩර් පත්‍රයෙහි අකුරෙන් හා ඉලක්කමෙන් දැක්විය යුතුය. එසේ අකුරෙන් හා ඉලක්කම්වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීම් හෝ අමුතු එක්කිරීම් කළහොත් ඒ බව ටෙන්ඩර්කරු විසින් තම කෙටි අත්සන යොදා සැබෑ බවට සහතික කළ යුතුයි.

7. වර්ෂ 1973 නොවැම්බර් මස 20 දින පෙ. ව. 10.05 ට පහත අත්සන් කරන ලද අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

8. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීමේ හා කොන්ත්‍රාත්තුව ඕනෑම අවස්ථාවක නවතාලීමේ සම්පූර්ණ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරී වෙත පැවරී ඇත.

9. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් කරන ලද කාර්යය ඉටුකිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට ටෙන්ඩර්කරුට සිදුවේ.

10. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකිවූ කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දින 10 ක් ඇතුළතදී බන්ධනාගාර කර්මාන්ත අධිකාරී සමග ගිවිසුමකට අත්සන් තැබිය යුතුය. එම කාලසීමාව ඇතුළත දී කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් තැබීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත් වුනිනම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම පැහැර හැර ගිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුළත් කරනු ඇත.

11. තවත් වැඩි විස්තර දැන ගැනීමට ඇවැසි නම් පහත අත්සන් අයගෙන් ලබා ගැනීමට පුළුවන.

12. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණකි.

ජී. එල්. පෙරේරා,
බන්ධනාගාර කර්මාන්ත අධිකාරී.

කර්මාන්ත කාර්යාලය,
වැලිකඩ බන්ධනාගාරය,
කොළඹ 9,
1973. 10. 26 වෙනි දින දිය.

11-233—73.11.02 වැනි දින අංක 84 දරන ගැසට් පත්‍රය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත අංශයට අයත් පාවිච්චියට ගත නොහැකි ටයර් විකිණීම

කොළඹ 9, වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත අධිකාරි විසින් පහත සඳහන් පාවිච්චියට ගත නොහැකි ටයර් විකිණීම සඳහා 1973 නොවැම්බර් මස 19 වැනි දින පූ.භා. 10.00 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| මිමි. | | ප්‍රමාණය |
|---|---|---|
| 640 × 14 | ... | 22 |
| 645 × 14 | ... | 2 |
| 520 × 14 | ... | 2 |
| 700 × 14 | ... | 2 |
| 695 × 14 | ... | 2 |
| 165 × 14 | ... | 1 |
| 800 × 14 | ... | 1 |
| 640 × 15 | ... | 9 |
| 670 × 15 | ... | 1 |
| 500 × 15 | ... | 2 |
| 700 × 15 | ... | 1 |
| 825 × 15 | ... | 1 |
| 775 × 15 | ... | 1 |
| 560 × 15 | ... | 2 |
| 750 × 15 | ... | 3 |
| 600 × 16 | ... | 28 |
| 525 × 16 | ... | 1 |
| 750 × 16 | ... | 6 |
| 700 × 16 | ... | 1 |
| 520 × 13 | ... | 4 |
| 640 × 13 | ... | 1 |
| 750 × 20 | ... | 20 |
| 825 × 20 | ... | 3 |
| 1100 × 20 | ... | 2 |
| 185 × 15 | ... | 1 |
| මුළු එකතුව | ... | 119 |

2. ටෙන්ඩර් පෝරම ලබාගැනීම සඳහා මෙම කායර්‍යාලයෙන් මුදල් භාර දෙන වවුචරයක් ලබාගෙන එයත් සමග රු. 20ක මුදලක් බන්ධනාගාර මූලස්ථානයේ සරප් කායර්‍යාලයෙහි තැන්පත් කර නිකුත් කරනු ලබන රිසිට් පත තමන් ඉදිරිපත් කරන ටෙන්ඩරයට ඇමිණිය යුතුය.

'' මේ සඳහා විශේෂ ටෙන්ඩර් පෝර්ම් නිකුත් කරනු නොලැබේ ''.

3. යම් ටෙන්ඩරයක් භාරගත් බව ලිපියකින් දන්වා දින හතක් (7) ඇතුළතදී එම ද්‍රව්‍යය ඉවත් කරගැනීම නොහැකිවී නම් හෝ ඉවත් කර ගැනීමේ කාර්ය්‍යය පැහැර හැරියේ නම් හෝ ටෙන්ඩර්පත් වෙනුවෙන් තැන්පත් කළ මුදල රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඇතුළත් කරනු ලැබේ. ටෙන්ඩර් පත පිළිගත් බව දන්වා යැවෙන ලිපිය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට යැවිණි නම් හෝ එම ස්ථානයෙහි තබා ආවේ නම් හෝ ටෙන්ඩර්කරුට සිය ටෙන්ඩරය පිළිගත් බව දන්වා යැවුණු සේ සලකනු ලැබේ. තැන්පත් කරන ලද ටෙන්ඩර් මුදල් ආපසු දෙනු ලබන්නේ ටෙන්ඩර් මණ්ඩලය විසින් පිළිගත් ටෙන්ඩර්කරු තෝරාගැනීමෙන් පසුය.

4. ටෙන්ඩර්කරුවන් විසින් සියළුම ටයර් වෙනුවෙන් ඒකාබද්ධ මිළක් සඳහන් කළ යුතුයි. වැඩිම මිළට ටයර් සියල්ලම දෙනු ලැබේ. ටෙන්ඩර් පත් ලියුම් කවරයක බහා සීල් තබා පහත සඳහන් අයගේ ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ පහත අත්සන් කරන අයගේ කායර්‍යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක. සෑම ලියුම් කවරයකම වම් කෙළවරේ '' පාවිච්චියට ගත නොහැකි ටයර් සඳහා ටෙන්ඩරය '' යනුවෙන් සඳහන් කළ යුතුය.

5. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ප්‍රථම ටයර් බැලීමට අවශ්‍ය වන ටෙන්ඩර් කරුවන් සිටී නම් එය සාමාන්‍ය වැඩ කරන දිනයන්හි පූ.භා. 8.00 සිට 11.00 සහ අ.භා. 1.00 සිට 3.00 දක්වාද සෙනසුරාද දිනයන්හි පූ.භා. 8.00 සිට 11.00 දක්වාද, වැලිකඩ බන්ධනාගාර කර්මාන්ත කායර්‍යාලයෙන් විමසීමෙන් මෙම ටයර් පරීක්ෂා කළ හැක. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩරයේ යම් මැකුමක් හෝ වෙනත් වෙනස් කිරීමක් කර තිබේ නම් එයට ඔවුන්ගේ අත්සන් තැබිය යුතුය.

6. ටෙන්ඩර් පත් 1973 නොවැම්බර් මස 20 වැනි දින පූ.භා. 10.00 ට කොළඹ 9, වැලිකඩ බන්ධනාගාර කර්මාන්ත අධිකාරිගේ කායර්‍යාලයේදී විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ඉදිරිපත් විය හැකිය.

7. තවත් වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය නම් පහත අත්සන් කරන අයගෙන් ඒවා ලබාගත හැක.

ඊ. එල්. පෙරේරා,
බන්ධනාගාර කර්මාන්ත අධිකාරි.

වැලිකඩ බන්ධනාගාරය,
කොළඹ 9,
1973 ඔක්තෝබර් මස 24 වැනි දින.

11–234—1973.11..02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1974 මුදල් වර්ෂය තුළ දර සැපයීම

1974 ජනවාරි මස 01 වෙනිදා සිට 1974 දෙසැම්බර් 31 වෙනිදා දක්වා වැලිකඩ බන්ධනාගාරයට කැලෑ දර සපයා භාරදීම පිළිබඳව බන්ධනාගාර කර්මාන්ත අධිකාරී විසින් 73. 11. 20 වෙනි දින පෙ. ව. 10.00 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

විස්තර මෙසේය :—

සැපයීම පිළිබඳව විස්තර පහත සඳහන් අයුරු :—

විෂ්කම්භය අඟල් 3 කට නොඅඩු වූද, අඟල් 12 ට නොවැඩි වූද, දිග අඟල් 18 කට නොඅඩු වූද, අඟල් 36 කට නොවැඩිවූද, ඉතා හොඳට වියලුනු තද මේරූ ගැටවලින් තොරවූද, දර කැබලි එවේලේම ප්‍රයෝජනයට ගැනීමට තරම් සුදුසු තත්වයක ඇති ඒවා විය යුතුයි. සපයනු ලබන දර ගොඩපර, දියපර, කවුකැරල්ල, මී, මිල්ල, හොර, සියඹලා, දවට, පලු, මිහිරිය, දන්, මොර, කුඹුක්, මූණමල්, මාදන්, අලුඹෝ ආදී තද ලී වර්ගවලට ඇතුලත් විය යුතුය. ටොන් ඩරයකට රාත්තල් 14 දක්වා ප්‍රමාණයකින් වියලීමට හා පොතු වලට අඩු කරනු ලැබේ.

එමෙන්ම, කැන්ද, ඇටඹ, රුක්අත්න, ගැවලියා, සපු, අඹ, ඇල්බීසියා, මාර, සැකුණ, ඊරිය, තික්, බලබොඩ ආදී බුරුල් ලී වර්ග වලට අයත් දර භාරගනු නොලැබේ.

2. බන්ධනාගාරවල හෝ කිච්චු කච්චේරියක රු. 50 ක් තැන්පත් කිරීමෙන් ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කර්මාන්ත අධිකාරීගෙන් 1973. 11. 19 වෙනි දින දහවල් 10.00 දක්වා දර සැපයීම සඳහා ආකෘති පත්‍ර ලබාගත හැක. එම ආකෘති පත් සමග අනුපිටපතක්ද එවිය යුතුය. පහත සඳහන් ආයතනයන් සඳහා ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී ටෙන්ඩර් තැන්පත් මුදල් ඇවැසි නොවේ.

(අ) සමූපකාර තොග වෙළඳ ආයතන,
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන,
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂක විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති,
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

3. ටෙන්ඩර් පත්‍ර සීල් කරන ලද කවරයක බහා එහි වම් කෙළවරෙහි " දර සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍රය " යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. තම ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවනු නොලැබේ නම්, ටෙන්ඩර්කරු විසින් හෝ ඔහුගේ නියෝජිතයා විසින් බන්ධනාගාර කර්මාන්ත කායර්‍යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් විවෘත කරන දින නියමිත වේලාවට පෙර බහාලිය යුතුයි.

4. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිළ ගණන් අකුරෙන් හා ඉලක්කමින් විය යුතුයි. එසේ නොමැති ටෙන්ඩර් ප්‍රතික්ෂේපවීමට ඉඩ ඇත.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වා යවා දින 10 ක් ඇතුලත දී බන්ධනාගාර කර්මාන්ත අධිකාරී තැන සමග ඒ පිළිබඳ ගිවිසුමකට නොබැඳුන හොත් ඔහු විසින් තැන්පත් කල ටෙන්ඩර් මුදල රාජසන්තක වීමට ද ඔහුගේ නාම රජයේ කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නාම ලේඛණයට ඇතුලත් වීමටද ඉඩ ඇත.

6 .හැම ටෙන්ඩරයක්ම 1973 නොවැම්බර් මස 20 වෙනි දින පෙ. ව. 10. 05 ට විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

7. ටෙන්ඩර් භාරගත් අවසාන දින සිට මාස තුනක් යනතුරු ටෙන්ඩර්කරුවන් විසින් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුය.

8. මෙයට පෙර රජයේ කොන්ත්‍රාත් භාර නොගත් ටෙන්ඩර් කරුවන්, ටෙන්ඩර් පෝරම ඉල්ලා සිටීමේදී තමන් පදිංචි පළාතේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී තැන විසින් සහතික කරන ලද, තම ස්ථිර ලිපිනය හා නිශ්චල දේපල විස්තර ඇතුලත් ලිපියක් ටෙන්ඩර් පෝරම නිකුත් කරන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුයි.

ඊ. එල්. පෙරේරා,
බන්ධනාගාර කර්මාන්ත අධිකාරී.

කර්මාන්ත කායර්‍යාලය,
වැලිකඩ බන්ධනාගාරය,
කොළඹ 9.
1973. 10. 24 දින,

11-235—1973. 11. 02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර් පිළිබඳ දැන්වීම්

**පොලිස් දෙපාර්තමේන්තුව**

1973.06.29 දින නිකුත් වූ රජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද, පහත සඳහන් භාණ්ඩ සඳහා වූ, ටෙන්ඩර් තීරණ.

| භාණ්ඩ | ලැබුණු මිළ ගණන් | භාරගත් ඒකක මිළ රු. ශ. | තෝරාගත් ටෙන්ඩර්කරු |
|---|---|---|---|
| කාකි නලා ලේන්යාඩ් | 3 | 4 50 | මිල්ටන්ස්, 84, 1වැනි හරස්වීදිය, කොළඹ 11 |
| විශේෂ පොලිස් උප සේවා තොප්පි | 2 | 21 0 | ආර්. රත්නරාජන් මහතා, 12, රොබට්ස් වීදිය, දෙහිවල |
| කාන්තා පොලිස් වැහිකබා | 4 | 20 0 | එම |
| උරහිස් පැලඳුම්පටි | 1 | 14 50 | සී. සී. ගුණවර්ධන මිය., එම්. 3/1, සොයිසා පුර මහල් නිවාස, මොරටුව |
| අත් කරපටි | 4 | 4 40 | එම |

ජී. පුංචිමහත්මයා,
පොලිස්පති වෙනුවට.

1973 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ 1, පොලිස් මූලස්ථානයේ දීය.

11—103—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රා.සි.ඉ.ස. දෙපාර්තමේන්තුවේ උතුරු මැද දිසාවේ 1973 සැප්තැම්බර් මස ටෙන්ඩර් ප්‍රතිඵල ලැයිස්තුව**

| අංකය | වැඩ පිළිබඳ විස්තර | ටෙන්ඩර්පත් කැඳවීමේ අවසාන දිනය | ලැබුන මුළු ටෙන්ඩර්පත් ගණන | තේරිපත්වූ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | පිළිගත් ටෙන්ඩර් මුදල රු. ශ. |
|---|---|---|---|---|---|
| 1. | රොටවැව වැඩි දියුණු කිරීම | 21.09.73 | 2 | ජී. බී. දියානායක මහතා එප්පාවල | 27,486 16 |
| 2. | හැලඹවැව වැඩි දියුණු කිරීම | 21.09.73 | 2 | එම | 13,479 0 |
| 3. | හළඹමැටිය වැව වැඩි දියුණු කිරීම | 21.09.73 | 2 | එම | 14,056 50 |

ජී. එස්. වික්‍රමසිංහ,
උතුරු මැද දිසාවේ වැඩ අධ්‍යක්ෂ.

1973.10.20 වැනි දින, අනුරාධපුරයේ දීය.

11—96—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම්

**වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව—දව වෙන්දේසිය—බස්නාහිර දිසාව**

තොග 1 කින් යුත් ගම්මාලු ලැලි සහ අඩි 32.9 ක් ද, තොග 10 කින් යුත් හරස් කියත් 1 ක් ද, පොරෝ 7 ක් සහ පිහියා 3 ක් ද රත්නපුර බස්නාහිර දිසා වන නිලධාරි විසින් 1973 නොවැම්බර් මස 15 වැනි දින පෙරවරු 9.30 ට බලංගොඩ අඩවි වන කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම භාණ්ඩ බලංගොඩ අඩවි වන කාර්යාලයේ ඇත. වෙන්දේසියේ ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන භවතුන් වෙන්දේසියට ප්‍රථම භාණ්ඩ බලා ගැනීමකට පත්වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. වෙන්දේසිය පිළිබඳ වැඩිදුර විස්තර රත්නපුර දිසාවන නිලධාරීගෙන් හෝ බලංගොඩ අඩවි වන නිලධාරිගෙන් ලබා ගත හැකිය.

එච්. ආර්. පීරිස්,
දිසා වන නිලධාරි—බස්නාහිර දිසාව.

දිසාවන කාර්යාලය,
රත්නපුර.

11-116—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : ලේ/10

**ප්‍රසිද්ධ වෙන්දේසිය**

මහෙස්ත්‍රාත් උසාවිය—තිස්සමහාරාමය

මෙම උසාවියේ නඩුවලට ඉදිරිපත් කළ අයිතිකරුවන් විසින් ඉවත් කරගෙන නැති සහ රාජසන්තක කරන ලද භාණ්ඩ තොගයක් 1973 දෙසැම්බර් මස 5 වෙනි දින පස්වරු 12.30 ට උසාවි භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බවට මහජනයාට මෙයින් දැනුම් දෙමි.

එදින උදේ 10 ට එම භාණ්ඩ බලා ගැනීමට ඉඩ සලසනු ලැබේ. විකිණීමට නියමිත භාණ්ඩවල සම්පූර්ණ ලැයිස්තුවක් වෙන්දේසි දිනට සතියකට පෙර උසාවි දැන්වීම් පුවරුවේ පලකරනු ඇත.

පී. ඇම්. වරුසවිතාන,
මහෙස්ත්‍රාත්.

1973 ක්වූ ඔක්තෝම්බර් මස 20 වැනි දින,
තිස්සමහාරාම,
මහෙස්ත්‍රාත් උසාවියේ දී ය.

11-41—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : ලේ/10

**ප්‍රසිද්ධ වෙන්දේසිය**

මහෙස්ත්‍රාත් උසාවිය—හම්බන්තොට

මෙම උසාවියේ නඩුවලට ඉදිරිපත් කළ අයිතිකරුවන් විසින් ඉවත් කරගෙන නැති සහ රාජසන්තක කරන ලද භාණ්ඩ තොගයක් 1973 නොවැම්බර් මස 26 වෙනි දින පස්වරු 12.30 ට උසාවි භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බවට මහජනයාට මෙයින් දැනුම් දෙමි.

එදින උදේ 10 සිට එම භාණ්ඩ බලා ගැනීමට ඉඩ සලසනු ලැබේ. විකිණීමට නියමිත භාණ්ඩවල සම්පූර්ණ ලැයිස්තුවක් වෙන්දේසි දිනට සතියකට පෙර උසාවි දැන්වීම් පුවරුවේ පලකරනු ඇත.

පී. ඇම්. වරුසවිතාන.
මහෙස්ත්‍රාත්.

1973 ක්වූ ඔක්තෝම්බර් මස 20 වැනි දින,
හම්බන්තොට,
මහෙස්ත්‍රාත් උසාවියේ දී ය.

11-40—73.11.02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

### වෙන්දේසියේ විකිණීමයි

කොළඹ මහ තැපැල් කාර්යාලයේ තැපැල් තක්සේරුකරුගේ ශාඛාව

පහත සඳහන් භාණ්ඩ 1973 නොවැම්බර් මස 9 දින ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන අතර වෙන්දේසිය පෙරවරු 9.30 ට ආරම්භ වේ. 1973 නොවැම්බර් මස 7 දින පෙරවරු 9.30 සිට දිවා 12.00 දක්වා තැපැල් තක්සේරුකරුගේ කාර්යාලයේදී භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

2. රේගු අයකැමිගේ හෝ ඔහුගේ සහායකයින් කෙනෙකුගේ අනුමැතියට යටත්ව සහ මෙහි මින් මතු සපයා ඇති අවලංගු කිරීමේ අයිතියට යටත්ව, සාමාන්‍යයෙන් වැඩිම ඉල්ලුම්කරු ගැනුම්කරු වේ. ඉල්ලුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු අතර ඇතිවන කිසියම් මතභේදයකදී වෙන්දේසිය පවත්වන නිලධාරියාගේ තීරණය අවසාන තීරණය වේ.

3. හේතු ඉදිරිපත් නොකර ඕනෑම පුද්ගලයෙකුගේ හෝ පුද්ගල සිත්ගේ හෝ ලන්සුවක් පිළිගැනීමට, ප්‍රතික්ෂේප කිරීමට වෙන්දේසි පවත්වන නිලධාරියාට සහ අයකැමිට පුළුවන.

4. ලන්සුවක් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ භාණ්ඩ රේගුභූමියෙන් ඉවත් කර ගැනීමට පෙර ඕනෑම වේලාවකදී වෙන්දේසියක් අවලංගු කිරීමේ තනි අයිතිය අයකැමි වෙත තබා ගනී.

5. වෙන්දේසිය අවසානයේදී පිළිගන්නා ලද ලන්සුවේ වටිනාකම සම්පූර්ණයෙන්ම ගෙවීමෙන් පසු භාණ්ඩ භාරදීම කරනු ලැබේ.

6. මිලදී ගන්නා භාණ්ඩවල තත්ත්වය සහ ඒවායේ අඩංගු ප්‍රමාණ සම්බන්ධයෙන් ගැණුම්කරු තමාම සෑහීමට පත් විය යුතු අතර, එකී භාණ්ඩවල ගුණය, ප්‍රමාණය හෝ තත්ත්වය හෝ භාණ්ඩවල මාතෘකා නාමය පිළිබඳව අයකැමි සහතික නොකරයි. ඉදිරිපත් කර ඇති කොන්දේසි පිළිගෙන ඇත්නම් හැර කිසිම හේතුවක් නිසා ගැනුම් මිල අඩු කිරීමකට ගැණුම්කරුට හිමිකමක් නොලැබේ.

7. භාණ්ඩ පිළිබඳ විස්තරවල ඕනෑම වැරැද්දක් හෝ අත්හැරීමක් විය හැකි අතර, එවැනි වැරදි හෝ අත්හැරීම් හෝ කිසිම විධියකින් අවහිරයක් හෝ වෙන්දේසියට බලපෑමක් නොවිය යුතු මෙන්ම, ඒ වෙනුවෙන් කිසිම වන්දි ගෙවීමක් අනුමත නොකරන අතර, ලන්සු ලියාපදිංචි කිරීමෙන් පසු අනාවරණය වන අඩුවීම පිළිබඳව කිසිම මිල අඩුකිරීමක් නොකරන අතර, සහ ලන්සු තැබීමකට ප්‍රථම හැම කරුණක් පිළිබඳව මිලදී ගැනීමට බලාපොරොත්තු වන්නන් තෑ තමාම සෑහීමට පත්වී සිටී යයි බලාපොරොත්තු වනු ලැබේ.

8. කොළඹ 1, මහ තැපැල් කාර්යාලයේ තැපැල් තක්සේරුකරුගෙන් වැඩි විස්තර ලබා ගත හැකිය.

(1) ගෝනන වූල්
(2) ග්‍රැමපෝන් රෙකෝඩ් 10
(3) කොන්ත 170
(4) කතුරු
(5) අත් ඔරලෝසු කොටස—ඩයල් 1440, බැලන්ස් වීල් 900 කවු 200, වයින්ඩින් ක්‍රවුන් 5000
(6) ඔරලෝසු පටි 1000
(7) ට්‍රැක්ටර් අමතර කොටස්
(8) වතුර උෂ්ණත්වය මනින මීටරයක්
(9) ඉන්දන මීටරයක්
(10) ජෝගු 5
(11) අළු බඳුන් 10
(12) කියත් තල 5
(13) බෝල් පොයින්ට් පෑන් 34, උල්පත් පෑන් 8, ජේනරින් ස්ටික් පැකට් 12
(14) "වොෂිබා" විදුලිය රැවුල කපන යන්ත්‍ර 3
(15) "ක්‍රොස්ව් උල්පත් පෑන් දුසිම 6 යි. "ශූන්" උල්පත් පෑන් දුසිම 2 යි. "හිරෝ" උල්පත් පෑන් දුසිම 1 යි. ඉඩ යතුරු දුසිම 54 ක්
(16) අව් කන්නාඩි සහ තවත් භාණ්ඩ රැසක්

ඒ. එම්. පී. ජයවර්ධන,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

තැත/73/විකිණීම/5.
තැපැල් තක්සේරු අංශය,
මහ තැපැල් හල,
කොළඹ.

11—112—73. 11. 02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

### වැලිමඩ ගම්බද උසාවියේ යතුරු ලියනය වෙන්දේසි කිරීම

වැලිමඩ ගම්බද උසාවියේ ඇති අංක 3 ඒ 96330 දරණ "කොරෝනා" වර්ගයේ (කුඩා) ඉංග්‍රිසි යතුරු ලියනය 1973.11.27 වැනි දින පෙ. ව. 10 ට වැලිමඩ ගම්බද උසාවියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වමි.

ප්‍රාදේශීය උසාවි පාලක ලේකම්,
බදුල්ල.

1973 ඔක්තෝබර් මස 18 වැනි දින,
බදුල්ලේ ප්‍රාදේශීය උසාවි පාලන ලේකම් කාර්යාලයේ දීය.

11-33—73. 11. 02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : ආ/10/71

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

මහේස්ත්‍රාත් උසාවිය—බලපිටිය

මෙම උසාවියේ නඩුවල රාජසන්තක කළ හා හිමිකම් නොපාන ලද මෙහි පහත සඳහන් භාණ්ඩද ඇතුළත් තවත් භාණ්ඩද, 1973 ක්වූ නොවැම්බර් මස 21 දින පෙ. ව. 9.00 ට බලපිටිය මහේස්ත්‍රාත් උසාවියේදී ගාල්ලේ ප්‍රාදේශීය උසාවි පාලක ලේකම් ඉදිරිපිටදී වෙන්දේසියේ විකුණන බවට මහජනයාට මෙයින් දැනුම් දෙමි.

විකිණීමට නියමිත භාණ්ඩවල සම්පූර්ණ ලැයිස්තුවක් වෙන්දේසි දිනට සතියකට පෙර උසාවි දැන්වීම් පුවරුවේ පළ කරනු ඇත.

බඩු මිලදී ගන්නන් විසින් එවලේම මුදල් ගෙවා බඩු ඉවත් කර ගත යුතුයි.

1973 ඔක්තෝබර් 20 දින,
බලපිටිය මහේස්ත්‍රාත් උසාවියේදී ය.

එස්. ඔගස්ටින් සිල්වා,
මහේස්ත්‍රාත්, බලපිටිය.

| නඩු අංකය | | භාණ්ඩය |
|---|---|---|
| ඒ586/72 | ... | අංක සිකේ1347 දරන රැලේ වශීයේ පාපැදිය |
| 49889 | ... | අංක ඒ24903 දරණ අබලන් පාපැදිය (රජ වශීය) |
| ඒ1027/70 | ... | අංක සිවී. 1343 දරණ රැලේ වශීයේ පාපැදිය |
| 55747 | ... | අංක බිබි: 54211 දරණ රැලේ වශීයේ පාපැදිය |
| 63824 | ... | අත් ඔර්ලෝසු 1 යි |
| 58426 | ... | ලෙරෙක්ස් වශීයේ අත් ඔර්ලෝසු 1 යි. |
| 892බ/ඊ | ... | අත් ඔර්ලෝසු 1 යි. |
| අංක නැත | ... | ප්‍රධාන ස්විච් 2 යි (මේන් ස්විච්ස්). |

11-177—75 11. 02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**මාතර දිස්ත්‍රික් උසාවියේදිය**

**උගස් නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියක්**

නඩු අංක ඇම්.බී. 2026

ඉහත කී නඩුවෙන් මට ලැබී තිබෙන බලය පිට ඉහත සඳහන් විත්තිකරුගත් පැමිණිලිකාරයාට අයවිය යුතු වූ රු. 1,511.00 අයකර ගැනීම පිණිස මෙහි පහත සඳහන් දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ 1973 ක්වූ නොවැම්බර් මස 17 වෙනි දින උදේ 11 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

**උපලේඛනය**

අකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ දියගහ පිහිටි උපලාවත්ත නමැති ඉඩමේ බෙදා වෙන්කල අංක 3 දරන කැබැල්ල වන රූ. 1, ප. 00.33 ක් විශාල ඉඩම වේ. සියලු ගහකොළ පලතුරු සමග බිමෙන් නොබෙදූ දෙකෙන් පංගුව සහ එහි ඇති ගෙයද වේ.

වැඩි විස්තර ඇම්. ආර්. රසීක් මහතාගෙන් හෝ මගෙන් විමසන්න.

කච්චේරි,
පිත්තලවීදිය,
මාතර.
1973 ඔක්. 17.

ජාන් ද සිල්වා සපු කොටන,
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

11–136—73. 11. 02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

---

**අනුරාධපුර හෙළබැවේ ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසිය නැවැත්වීම**

අනුරාධපුර දිසා අධිකරණයේ අංක 6616 සහ 6988 දරණ උගස් කර නඩු දෙකේ නියෝග යටතේ 1973. 10. 27 වැනි දින පෙරවරු 11 ට පැවැත්වීමට ප්‍රසිද්ධ කල ඉඩම් වෙන්දේසිය නතර කරණ ලදී.

බී. ජී. විජයවර්ධන,
උසාවියේ කොමසාරිස් සහ වෙන්දේසි

බසවක්කුලම, අනුරාධපුරය,
1973. 10. 20.

11-147—73. 11. 02 දින අංක 84 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවක් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාදා පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

**5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නාට නියමිත " පිටපත " කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

**7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

**11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

**13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු*—**

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ | | තැපැල් ගාස්තු මෙරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... | 0 | 50 | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... | 1 | 0 | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 | 30 | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 | 60 | 0 | 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ඇපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම යැවිය යුතුය.**

සැ. යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ඔක්තෝබර් | 73.10.05 | සිකුරාදා | ... | 73.09.25 | අඟහරුවාදා | දවල් | 12.00 |
| | 73.10.12 | සිකුරාදා | ... | 73.10.03 | බදාදා | දවල් | 12.00 |
| | 73.10.19 | සිකුරාදා | ... | 73.10.10 | බදාදා | දවල් | 12.00 |
| | 73.10.26 | සිකුරාදා | ... | 73.10.17 | බදාදා | දවල් | 12.00 |
| නොවැම්බර් | 73.11.02 | සිකුරාදා | ... | 73.10.24 | බදාදා | දවල් | 12.00 |
| | 73.11.09 | සිකුරාදා | ... | 73.10.31 | බදාදා | දවල් | 12.00 |
| | 73.11.16 | සිකුරාදා | ... | 73.11.07 | බදාදා | දවල් | 12.00 |
| | 73.11.23 | සිකුරාදා | ... | 73.11.14 | බදාදා | දවල් | 12.00 |
| | 73.11.30 | සිකුරාදා | ... | 73.11.21 | බදාදා | දවල් | 12.00 |
| දෙසැම්බර් | 73.12.07 | සිකුරාදා | ... | 73.11.28 | බදාදා | දවල් | 12.00 |
| | 73.12.14 | සිකුරාදා | ... | 73.12.05 | බදාදා | දවල් | 12.00 |
| | 73.12.21 | සිකුරාදා | ... | 73.12.12 | බදාදා | දවල් | 12.00 |
| | 73.12.28 | සිකුරාදා | ... | 73.12.19 | බදාදා | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.